



# ක්‍රිස්තු ධර්මය

## 7 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය





ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

# ක්‍රිස්තු ධර්මය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2008 සිට ක්‍රියාත්මකයි)

7 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

නව සහශ්‍රයේදී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ පවතින යම් යම් ගැටළු නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ හා සමාජයීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාශයෙනී.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේදී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේය. නමුදු වර්තමානයේදී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. මෙම පසුබෑමට හේතුව කිසිදු නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක්ම තීරණ ගනිමින් ඒ දේ පමණක්ම නැවත නැවත ඉදිරිපත් කිරීමේ හේතුවෙනී.

මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂය මාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ කුසලතා හා නිපුණතා වැඩි වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරයේ පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතුවේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරි වනු ඇතැයි යනු අපගේ පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මගපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේදී මෙන්ම ශිෂ්‍යයන් ඇගයීමේදී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුනට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් ලෙස උපකාරී වනු නොඅනුමානය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින්ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීමය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුනට, හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරි වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගිවූ සියලු දෙනාටම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

**මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ**
*අධ්‍යක්ෂ ජනරාල්*
*ජාතික අධ්‍යාපන ආයතනය*

# සංදේශපනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසැල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතුය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ඔබ විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා අතින් සිදුවිය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බැවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශ භාවිතා කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

මෙහි හමුවන ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පංති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගැනීම සහ තම යහළු යෙහෙලියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හී දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මකව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතුය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතුය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි කොට සංවිධානාත්මකව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතුය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයකට ය. එම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මහ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කරගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැමවිටම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැනද සැලකිලිමත් වන්න.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තවදුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීම කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැනද සැලකිලිමත් වන්න.

මෙමඟින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම, එයටම ගැළපෙන ගුරු භූමිකාවක් හා පංතිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම අපේක්ෂා කරමි.

**විමල් සියඹලාගොඩ**
*සහකාර අධ්‍යක්ෂ ජනරාල්*
*(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)*
*ජාතික අධ්‍යාපන ආයතනය*

## උපදේශක මණ්ඩලය සහ ලේඛක මණ්ඩලය

උපදේශනය : **මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**විමල් සියඹලාගොඩ මහතා**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

අධ්‍යක්ෂණය : **ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
අධ්‍යක්ෂ - ආගම්

සම්බන්ධීකරණය : ආචාර්ය ගරු ජයලත් බලගල්ල පියතුමා

ලේඛක මණ්ඩලය :

- **ශාස්ත්‍රපති ගරු එස්. ඩී. සෙල්වන් දේවගැතිතුමා -** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය
- **ශාස්ත්‍රවේදී හාසිනී ප්‍රනාන්දු මෙන්ඩිස් මහත්මිය** (විදුහල්පති 1), දින පාසල් සම්බන්ධීකරණ ලේකම් - ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
- **ශාස්ත්‍රපති ඩබ්ලිව්. එන්. මදාරා ප්‍රනාන්දු මෙනෙවිය**, ආචාරිනි මෙතෝදිස්ත විදුහල, කොළඹ 3
- **වානිජවේදී සුමුදිනි ප්‍රනාන්දු මහත්මිය,** ආචාරිනි නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය, මීගමුව

පිටකවරය සහ චිත්‍රය : ඩබ්ලිව්. එන්. මදාරා ප්‍රනාන්දු මෙනෙවිය

## කිතුනු උපදේශක මණ්ඩලය

- ගරු දේවධර්මාචාර්ය ජයසිරි ටී. පීරිස් දේවගැතිතුමා
  (සාමාන්‍ය ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය)

- ගරු ඩබ්ලිව් එබෙනෙසර් ජෝශප් දේවගැතිතුමා
  (මහානායක - ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව)

- ගරු කිංස්ලි පෙරේරා දේවගැතිතුමා
  සභාපති බැප්ටිස් සංගමය

- ගරු කේ. පියදාස දේවගැතිතුමා
  සභාපති, ප්‍රේස්බිටීරියන් දේවස්ථානය

# පටුන

පෙරවදන

සංදේශය

ලේඛක මණ්ඩලය

## 1 කොටස

**විෂය නිර්දේශය**

7.1.1 හැඳින්වීම 01
7.1.2 විෂය අරමුණු 02
7.1.3 විෂය නිර්දේශය 04
පන්තියට අදාළ නිපුණතා
නිපුණතාව
නිපුණතා මට්ටම
විෂය අන්තර්ගතය
කාලච්ඡේද ගණන

7.1.4 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය 07
7.1.5 පාසැල් ප්‍රතිපත්ති හා වැඩසටහන් 08
7.1.6 තක්සේරුව හා ඇගයීම 09

## 2 කොටස

**ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය**

7.2.1 හැඳින්වීම 12
7.2.2 ගුණාත්මක යෙදවුම් 14
7.2.3 ආදර්ශ ක්‍රියාකාරකම් සන්නතිය 16

## 3 කොටස

**තක්සේරුව හා ඇගයීම**

7.3.1 හැඳින්වීම 72
7.3.2 ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ 74
7.3.3 මූලාකෘති ප්‍රශ්න 76

1 කොටස

## විෂය නිර්දේශය

7.1.1 හැඳින්වීම

7.1.2 විෂය අරමුණු

7.1.3 විෂය නිර්දේශය

7.1.4 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

7.1.5 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

7.1.6 තක්සේරුව හා ඇගයීම

## 7.1.1 විෂය හැඳින්වීම

ශිෂ්‍යයකු ලෙස පමණක් නොව වැඩිහිටියෙකු ලෙසද අප ජීවත් විය යුත්තේ විවිධ ජාතීන්, විවිධ ආගමිකයන් හා සංස්කෘතීන් මධ්‍යයේය. මේ බහුවිධතාවය තුළ සුහදතාවය රකිමින් සදාචාර සම්පන්න, ගුණගරුක පුරවැසියන් මෙන් ක්‍රියා කිරීම සිදුවිය යුත්තකි. ඒ සඳහා මඟ පෙන්වීම ලබාදෙන ප්‍රධාන කාරකය ආගමයි. නමුත්, එය දැනුමෙන් පමණක් ලබාගත නොහැකිය. දැනුම උකහා ගෙන ඒ තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමක් සිදුවිය යුතුය.

නිපුණතා මූලික කොට ගෙන නව නිර්දේශය සකසා ඇත්තේ ඒ අරමුණ ඉටුකර ලීමටය. නිපුණතාවයක් යනු දැනුම, කුසලතා, හා ආකල්ප එකිනෙක සම්බන්ධ කොට ඒවා ජීවිත පුරුද්දක් කරගැනීම යැයි සරලව හැඳින්විය හැකිය.

මේ අරමුණ එක්වරම ඉටු කළ නොහැකි අරමුණකි. 6-11 වසර දක්වාම පාසල් අධ්‍යාපනය තුළින් අප උත්සාහ ගන්නේ මෙය ඉටුකර ලීමටය. බොහෝ විට ශිෂ්‍යයාගේ අනිවාර්ය අධ්‍යාපනය ලෙස ආගම ඉගෙනුම 11 වසරින් අවසන් වේ. උසස් අධ්‍යාපනය ලෙස තම ආගම තෝරා ගනු ලබන්නේ අතළොස්සකි. එහෙයින් 6-11 වසර තෙක් වන අධ්‍යාපනය අපට මහඟු වස්තුවකි. ඒ කාලවකවානුව තුළ දරුවා ඉගෙන ගත් සියල්ල ගොනු කර ප්‍රායෝගික ජීවිතයට මඟ පෙන්වා ගත හැකි වන සේ ඔවුන්ට මඟ පෙන්වීම ගුරුවරයා සතු වගකීමකි. මේ සඳහා සෑම ගුරුවරයෙකුම ඉවසිල්ලෙන් උත්සාහ ගන්නා සේම තම ජීවිතයෙන් ආදර්ශ වන බවද අපි දනිමු.

ක්‍රිස්තු ධර්මය වචනාර්ථයෙන් ඔබ්බට යමින් අර්ථාන්විතව හා සිත් ගන්නා ආකාරයට ශිෂ්‍යයන් වෙත ගෙනඒමට මේ නව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටුවහලක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

## 7.1.2 විෂය අරමුණු

1. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයා හට තම මැවුම්කරුවාණන් හඳුනා ගැනීමට සැලැස්වීම.

2. ක්‍රිස්තුස්වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිණත කිතුනු ජීවිතයක් ගත කිරීමට සැලසීම.

3. දේව වචනය තුළින් පෝෂණය ලබා කිතුනු ජීවිතයට සමාජය තුළ සාක්ෂි දැරීමට සැලසීම.

4. මූලික කිතුනු සදාචාරය ගොඩනංවන බයිබල් ඉගැන්වීම තුළින් ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කරවීම.

5. ඇදහිල්ලෙන් හා යාච්ඤාවේ බලයෙන් ශක්තිමත්වී සමාජයේ ලුණු ලෙස ක්‍රියාකරමින් ලෝකයට ආලෝකයක් පැතිරීමට මහපෙන්වීම.

6. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමයෙහි වර්ධනය වී එම ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට සැලසීම.

7. තමා අවට ස්වාභාවික පරිසරය දෙවියන්වහන්සේගෙන් ලද තිළිණයක් සේ සලකා එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කිරීම.

8. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුනු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක කරවීම.

9. කිතුනු විශ්වාසය රැකගන්නා අතරම සෑම ආගමක්ම ගරු කිරීමට පුරුදු කරවීම.

10. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කරවීම.

විෂයට අදාළ නිපුණතා :

1. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයා තම මැවුම්කරුවාණන් හඳුනාගෙන උන්වහන්සේ කෙරෙහි වූ විශ්වාසය තහවුරු කර ගනියි.

2. ක්‍රිස්තුන්වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගනිමින් පරිණත කිතුනු ජීවිතයක් ආදර්ශනය කරයි.

3. දේව වචනය හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබමින් කිතුනු ජීවිතයට සමාජය තුළ සාක්ෂි දරයි.

4. මූලික කිතුනු සදාචාරය ගොඩනංවන බයිබලයේ ඉගැන්වීම් තුළින් ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කරගනියි.

5. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී සමාජය ආලෝකවත් කරන ආලෝකයක් සේ ක්‍රියා කරයි.

6. ක්‍රිස්තුන්වහන්සේගේ අසීමිත ප්‍රේමයෙහි වර්ධනය වී එම ප්‍රේමය අප සමාජය තුළ පතුරුවාලීමට සලසයි.

7. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් සේ සලකා එය සුරැකීමටත්, සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කර ගනියි.

8. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුනු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහි කිරීමට දායක වෙයි.

7.1.3 විෂය නිර්දේශය

# ක්‍රිස්තු ධර්මය

## 7 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාල පරිච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 දේව ඇදහිල්ල පදනම් කරගනිමින් යහපත් ජීවිත ගත කරයි. | 1.1 ජීවීන්ට හිතකර පරිසරය තුළින් දේව ප්‍රේමයට සාක්ෂි දරයි. | ජීවීන්ට හිතකර පොළෝතලය<br>උත්පත්ති 1:1-2, 9-10<br>ජෝබ් 38:24-38<br>ගීතාවලිය 65: 6-9<br>ගීතාවලිය 104:14 | 01 |
| | 1.2 සත්ත්ව ලෝකයේ යහපත් ගුණාංග අඛණ්ඩව වර්නායනය කරමින් දෙවියන්ව හන්සේගේ ක්‍රමයට සාක්ෂි දරයි. | සත්ත්ව ලෝකය<br>උත්පත්ති 1:20-25<br>හිතෝපදේශ 6:6-8<br>හිතෝපදේශ 14:4 | 01 |
| | 1.3 ආලෝක වස්තු වලින් දේව ප්‍රේමය ගැන සාක්ෂි දරයි | ආලෝක වස්තූන්<br>උත්පත්ති 1:14-19<br>ගීතාවලිය 136:7-9 | 01 |
| | 1.4 සාගර හා ජල සම්පත් තුළින් දේව ප්‍රේමය පිළිබඳ සාක්ෂි දරයි. | සාගර හා ජල සම්පත්<br>උත්පත්ති 1:10<br>ගීතාවලිය 104:24-26 | 01 |
| | 1.5 දෙවියන් වහන්සේ මිනිසා සමඟ බවට සාක්ෂි දරයි. | දෙවියන්වහන්සේ මිනිසා සමඟයි.<br>ගීතාවලිය 121<br>මතෙව් 1:23<br>යෙසායා 7:14<br>උත්පත්ති 1:2 | 01 |
| 2.0 ජේසුස් වහන්සේගේ ජීවිතය වර්නායනය කරයි. | 2.1 එලියා දෙවියන් වහන්සේගේ දේව බලය ගැන සාක්ෂි දරන්නාක් මෙන් ජේසුස් වහන්සේගේ ගතිගුණ පිළිබඳ සාක්ෂි දරයි. | එලියා දිරිමත් වේ.<br>මතෙව් 6:25-34<br>මතෙව් 5:7-9<br>ලූක් 9:54<br>1 රාජාවලිය 21<br>1 රාජාවලිය 19:17<br>1 රාජාවලිය 17:8-23 | 02 |
| | 2.2 දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව පාළුකරයේ සංරක්ෂණය කළාක් මෙන් අද ජේසුස් වහන්සේගේ ගුණාංග තුළින් ලබන සංරක්ෂණය පිළිබඳව සාක්ෂි දරයි. | පාලුකරයේදී පෝෂණය.<br>නික්මයාම 17:1-6<br>ගීතාවලිය 105<br>ජොහාන් 1:1-15<br>මර්ක් 6:22-44 | 02 |
| | 2.3 ඊශ්‍රායෙල් ජනතාව පීඩනයට පත්කළ අයගෙන් ඔවුන් රතු මුහුදේදී බේරා ගත්තාක් මෙන් දෙවියන් ව හන්සේගේ ගුණාංග මඟින් අප ආරක්ෂා කරනු ලැබීම පිළිබඳව සාක්ෂි දරයි. | රතු මුහුද තරණය<br>නික්මයාම 14:15-31<br>මාර්ක් 5:35-41<br>මාර්ක් 9:2-14<br>මාර්ක් 14:32-42 | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාල පරිච්ඡේද ගණන |
|---|---|---|---|
| | 2.4 ජේසුස් වහන්සේ දෙන නව පිබිදීම තුළ නොසැලී සිටියි. | ශ්‍රාවකයන්ට දිරිය<br>ශු මාර්ක් 6:45-52<br>යෙසායා 11:1<br>එළිදරව් 21:1-5 | 02 |
| | 2.5 කඩවුණු බලාපොරොත්තු මැද ජේසුස් වහන්සේ වෙතින් දිරි ලබා ප්‍රාණවත් වෙයි. | එම්මාවුස් ගමන<br>ශු ලූක් 24:13-35<br>ගීතාවලිය 23:3-4<br>මාර්ක් 16:1-8 | 02 |
| | 2.6 ජේසුස් වහන්සේ තුළින් ලබන පෝෂණය පිළිබඳව සාක්ෂි දරයි. පෝෂණය ලබයි. | පන්දහසකට පෝෂණය<br>ශු ජොහාන් 6:1-13<br>ක්‍රියා 2:42-47 | 02 |
| | 2.7 ජේසුස්වහන්සේ මෙන් නපුරට අභියෝග කරමින් ජීවත් වෙයි. | කුණාටුවෙන් රැකවරණය<br>ලූක් 8:22-25<br>මාර්ක් 61:45-52<br>ජොහාන් 18:23<br>ලූක් 5:42<br>මතෙව් 8:23-27 | 02 |
| 3.0 දේව රාජ්‍යයේ ඉගැන්වීම් අනුගමනය කරමින් සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කරයි. | 3.1 දිළින්දන් දේව රාජ්‍යයේ පුරවැසියන් බව පිළිගෙන ජීවත් වෙයි. | මංගල වාක්‍ය (මිටියාවතේ දේශනය )<br>ශු ලූක් 6:22-36<br>මතෙව් 19:16-30<br>ලූක් 12:13-21<br>ලූක් 16:19-31<br>ලූක් 19:1-10 | 02 |
| | 3.2 ප්‍රේමය කේන්ද්‍ර කරගත් ජීවිත ගත කරයි. | ප්‍රේමය<br>ශු ලූක් 6:27-36<br>ශු ලූක් 10:25-37 | 03 |
| | 3.3 දේව රාජ්‍යත්වය තුළ සමාව පදනම් කරගෙන ජීවත් වෙයි. | සමාව<br>ලූක් 17:3-4<br>ශු ලූක් 23:32-34<br>ශු මතෙව් 18:21-35 | 03 |
| | 3.4 සේවක නායකත්වයේ ජීවිත ගත කරයි. | සේවක නායකත්වය<br>ශු ජොහාන් 13:1-20 | 03 |
| | 3.5 ප්‍රති උපකාර ලබා නොගැනීමේ වටිනාකමින් යුතුව ජීවත් වෙයි. | ආගන්තුක සත්කාරය<br>ශු ලූක් 14:7-23<br>ශු මතෙව් 10:40-42 | 03 |
| | 3.6 යහපත් ඵල දැරීමේ වටිනාකම් කේන්ද්‍ර කොටගත් ජීවිත ගත කරයි. | ඵල දැරීම<br>ශු ලූක් 6:43-45 | 03 |
| | 3.7 දරුවන්ට හිමි ස්ථානය ලබා දෙන ජීවිත ගත කරයි. | දරුවන්<br>ශු. මතෙව් 18:1-5<br>ශු මතෙව් 19:13-15 | 03 |
| | 3.8 කාන්තාවන්ට නිසි සමාජ තත්ත්වයක් ලබා දෙමින් ජීවත් වෙයි. | කාන්තාවන්<br>ශු ලූක් 10:38-42<br>ලූක් 8:1-2<br>රෝම 16:1 | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාල පරිච්ඡේද ගණන |
|---|---|---|---|
| | 3.9 පව්කරුවන් යැයි සලකන්නන්ට වැදගත්කමක් දෙමින් ජීවත් වෙයි. | පව්කරුවන්<br>ශු ලූක් 5:27-32<br>ලූක් 7:36-50<br>ලූක් 15<br>ලූක් 18:9-14 | 03 |
| | 3.10 සියල්ලන් පිළිගනිමින් ජීවත් වෙයි. | සමාජයෙන් කොන්වූවන්<br>ශු ලූක් 5:12-16<br>ලෙවී 13:14 | 03 |
| 4.0 ශු බයිබලය දිනපතා ජීවිතයට මාර්ගය කර ගනියි. | 4.1 මේරි ජෝන්ස් මෙන් කැපවීමකින් යුතුව ක්‍රියා කරයි. | මේරි ජෝන්ස්ගේ ප්‍රයත්නය | 02 |
| | 4.2 තෝමස් චාල්ස් දේවගැති තුමා තුළ පැවති ප්‍රයත්නය වැනි කැපවීමකින් යුතුව ජීවත් වෙයි. | තෝමස් චාර්ල්ස් තුළින් ලෝක ව්‍යාප්තියට වූ සේවය | 02 |

## 7.1.4 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ආගම විෂය, විෂය මාලාවට ඇතුලත් කිරීමේ මූලික අභිප්‍රාය වනුයේ, දරුවන් තුළ සදාචාර වර්ධනයයි. ඒ අනුව ක්‍රිස්තු ධර්මය විෂය තුළින්ද, දරුවන් තුළ ආකල්ප වර්ධනයක්, මනා හික්මීමක් හා ආත්ම සංයමයක් ඇතිකිරීම අපේක්ෂිතය. ඒ සඳහා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය චරිතායනය කරමින් සිය දෛනික ජීවිත රටාව හැඩගස්වා ගැනීම අභිප්‍රාය කෙරේ.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා විෂය කරුණු අවධාරණය කරන අතරම, එම විෂය කරුණු ප්‍රායෝගීකරණය කිරීම බලාපොරොත්තු වේ. 7 ශ්‍රේණියේ සිසුන් සඳහා මෙම විෂය මාලාව ක්‍රියාත්මක කිරීමේදී යථෝක්ත සාරධර්ම සිය පවුල තුළින් වර්ධනය කොට, පන්ති කාමරය, පාසල හා සමස්ත සමාජය දක්වා ව්‍යාප්ත කිරීමට සිසුන් යොමු කළ යුතු වේ. ඒ සඳහා ඉවහල් කරගත හැකි මෙම විෂය මාලාවට අදාළ ක්‍රමෝපායයන් කිහිපයක් පහත දක්වා ඇත.

1. පරිසර සංරක්ෂණයට අදාළ ව්‍යාපෘතිවල යෙදවීම.
   උදා: පාසල් වත්ත තුළ පැල තවානක්/ඔසු උයනක් සැකසීම.

2. ශ්‍රමදාන කටයුතු සංවිධානය කිරීම.

3. පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

4. උපදේශන වැඩමුළු සංවිධානය කිරීම.

5. රෝගීන්ට උපස්ථාන කිරීමේ සේවාවන් වල යෙදවීම.

6. ළමා හා වැඩිහිටි නිවාසවලට අදාළ සේවාවන් සඳහා යොමු කරවීම.

7. ළමා/කාන්තා පුනරුත්ථාපන වැඩසටහන්වලට සහභාගි කරවීම.

8. පාස්කු හා නත්තල් වැඩ සටහන් සංවිධානය කිරීම.

9. කිතුනු දින සංවිධානය කිරීම.

10. කිතු දහම හා සම්බන්ධ විවිධ ආයතන හඳුන්වා දීමට චාරිකා සංවිධානය කිරීම.

11. දේවස්ථාන අනුබද්ධ ආයතනවලට සිසුන් යොමු කිරීම.

මෙවැනි ක්‍රමෝපායන් මගින් පන්ති කාමරයේදී ලබන දැනුම අත්දැකීමක් බවට පත්කොට ගෙන දහම හා ජීවිතය අතර මනා සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව ලැබෙනු ඇත. ඉහත නිදසුන් ලෙස යෝජිත ක්‍රමෝපායනට අමතරව වෙනත් විවිධ ක්‍රමෝපායන් වෙත ශිෂ්‍යයන් අවස්ථානුකූලව යොමු කරවීමට මෙම නව විෂය නිර්දේශය මගින් ගුරුවරයාට ඉඩ සලසා ඇත.

### 7.1.5 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

1. පාසල් වාරය තුළදී අවම වශයෙන් එක් වතාවක් වත් දේව නමස්කාර මෙහෙයකට පන්තියක් වශයෙන් සිසුන් සහභාගි කරවීම.

2. සිසුන්ගේ ආත්මික වර්ධනය සඳහා ගරු දේවගැතිතුමන්ලාගේ මග පෙන්වීම හැකි සෑමවිටම ලබාගැනීම.

3. ඒ ඒ කාලවලට අදාළ ජන වන්දනා පිළිවෙත් වලට ළමුන් හුරු කිරීම.

4. සාමූහික බව, සාධාරණත්වය, ආත්මික ඉවසීම, ඇතුළු ආගමික සංකල්ප වර්ධනය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසල තුළ සංවිධානය කිරීම.

5. කිතුනු ශිෂ්‍ය හා ළමා සමිති සමාගම් ආරම්භ කොට පිරිපුන් කිතුනු දිවියක් ගත කිරීමට සිසුන් පුරුදු පුහුණු කිරීම.

6. සභාවේ සේවා සමිති සමාගම් වලට සිසුන් සහභාගි කරවීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීම.

### 7.1.6 තක්සේරුව හා අගැයීම

- සෑම පාඩමක් අවසානයේදීම ලිඛිත අභ්‍යාස සහ පැවරුම් මගින්
- වාර අවසානයේදී සහ වසර අවසානයේදී සිදුකරන විධිමත් පරීක්ෂණ මගින්
- කෙටිකාලීන ව්‍යාපෘති මගින්
- කියවීම, ලිවීම, සවන්දීම ඇසුරින් ආගමික දැනුම වාචිකව ඇගයීම
- ආගමික ක්‍රියාකාරකම්වල සහ පොදු යහපත සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන්වල යෙදෙන අන්දම නිරීක්ෂණය කිරීම මගින්
- සභාවේ සේවා සමිතිවලට බැඳී කරන සේවා මගින්
- පාසල තුළ පිහිටුවා ඇති ආගමික සමිති සමාගම්වලට බැඳී කරන සේවාව මගින්
- පන්තියේ නායකත්වය ගෙන වගකීම් භාරගැනීමේ රටාව නිරීක්ෂණය කිරීම මගින්
- 7 ශ්‍රේණියේ පාඨමාලාව අවසානයේදී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන සාධන පරීක්ෂණ මගින්
- පාසල් පාදක ඇගයීම් ක්‍රමය මගින්

# 2 කොටස

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

7.2.1 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

7.2.2 ගුණාත්මක යෙදවුම්

7.2.3 ක්‍රියාකාරකම් සන්තතිය

1.1 ජීවීන්ට හිතකර පොළෝතලය තුළින් දේව ප්‍රේමය අත්දකියි.

1.2 සත්ත්ව ලෝකයේ විවිධ චර්යා රටා මගින් අප ලබාගන්නා ආදර්ශ වරිතායනය කරයි.

1.3 ආලෝක වස්තූන් වලින් ප්‍රයෝජන ලබමින් දේව ප්‍රේමයට සාක්ෂි දරයි.

1.4 සාගර හා ජල සම්පත් තුළින් දේවාසිරි ලබමින් ඒවා සංරක්ෂණයට යොමු වෙයි.

1.5 දේව නිර්මාණයෙන් අනාවරණය වන දේව ප්‍රේමයේ අත්දැකීම් බෙදා ගනියි.

2.1 එලියා තුළින් දෙවියන් වහන්සේගේ දිරිය අත්දකියි.

2.2 පාළුකරයේ ඊශ්‍රායෙල් ජනතාව පෝෂණය කළ අයුරින් දෙවියන්වහන්සේ අපවද පෝෂණය කරන බව තහවුරු කර ගනියි.

2.3 ජීවිතයේ තීරණාත්මක අවස්ථාවලදී නිරතුරුවම දේව රැකවරණය ලබාගනියි.

2.4 නොපසුබටව නොසැලී සිටීමට ජේසුස් වහන්සේගෙන් දිරි ලබමින් ක්‍රියාකාරී වෙයි.

2.5 බලාපොරොත්තු කඩවූ අවස්ථාවලදී පවා ජේසුස් ස්වාමින් වහන්සේගෙන් ලැබෙන දිරිය මත යැපෙයි.

2.6 නිරතුරුවම ජේසුස් ස්වාමින් වහන්සේ තුළින් අධ්‍යාත්මිකව හා ශාරීරිකව පෝෂණය ලබයි.

2.7 ජේසුස් වහන්සේගේ රැකවරණය ලබමින් ජීවිත අභියෝගවලට මුහුණ දෙයි.

3.1 ජේසුස් වහන්සේගේ මිටියාවතේ දේශනය පදනම් කරගනිමින් ආදර්ශවත් කිතුනු ජීවිතයක් ගොඩ නගා ගනියි.

3.2 ප්‍රේමය ආදර්ශවත් කිතුනු ජීවිතයක පදනම බවට පත්කර ගනියි.

3.3 දෙවියන්වහන්සේගෙන් සමාව ලැබීමට මෙන්ම අන් අයට සමාව දීමට පෙළඹෙයි.

3.4 ජේසුස් වහන්සේගේ සේවක නායකත්වය වරිතායනය කරයි.

3.5 ප්‍රත්‍යුපකාර ලැබීමේ බලාපොරොත්තුවකින් තොරව ආගන්තුක සත්කාර දැක්වීමට පෙළඹෙයි.

3.6 හැකි සෑම විටම කිතුනුවකු වශයෙන් යහපත් ලෙස එල දරයි.

3.7 දරුවන් අගය කළ ජේසුස් වහන්සේගේ කැමැත්ත ඉටු කරයි.

3.8 කාන්තාවන්ට ද සමාජය තුළ හිමිවිය යුතු ස්ථානය පිළිබඳව යහපත් ආකල්ප ඇති කර ගනියි.

3.9 පව්කරුවන් පිළිබඳ ජේසුස්වහන්සේගේ ක්‍රියා පිළිවෙත අනුගමනය කරයි.

3.10 ජේසුස් වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් කිසිදු හේතුවක් මත කිසිවකු ප්‍රතික්ෂේප නොකරයි.

4.1 මේරි ජෝන්ස්ගේ අප්‍රතිහත ධෛර්යය ආදර්ශයට ගනියි.

4.2 තෝමස් වාල්ස්ගේ දායකත්වය අගය කරමින් තම ජීවිත තුළින් ජේසුස් වහන්සේ අන් අයට හඳුන්වා දෙයි.

## 7.2.1 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේදී ගවේෂණය පදනම් කරගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකිවන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුලව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (Transmission Role) හා පසුකාලීනව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (Transaction Role) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. අධ්‍යාපනය හදාරා සමාජයට පිවිසෙන දරු දැරියන්ගේ චින්තන කුසලතා හා සමාජ කුසලතාවල ගුණාත්මක වර්ධනය සඳහා ක්‍රමවේද සංවර්ධනය විය යුතු බව පිළිගත යුතු කරුණකි.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සළකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කරගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස් වලට අමතරව සිසු -සිසු අන්තර් ක්‍රියාද පසුව ඇතිවීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා සෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේදී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකුම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (Resource Person) තත්ත්වයට ගුරුවරයා පත්වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (Transformation Role) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම් වල පළමුවන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (Engagement Step) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම් වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබාගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම/පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (Flash Card) වැනි උත්තේජක යොදා ගැනීම/ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය/දෙබස, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (Demonstrations) සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කරගැනීම මුල් කොට ක්‍රියාකාරකම් වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (Exploration) සඳහා සිසුනට අවස්ථාව ලබාදීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කරගෙනය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකිවන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදුවේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතුව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම් වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබාගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමටද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතුය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමිවේ.

ක්‍රියාකාරකම් 3වන පියවරේදී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහිදී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (Explantation) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේදී සොයා ගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (Elaboration) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබාදීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

## 7.2.2 ගුණාත්මක යෙදවුම්

- ශුද්ධවූ බයිබලය/නව ගිවිසුම
- 7 වැනි ශ්‍රේණියේ පෙළ පොත
- සිතියම්
  පලස්තීනයේ සිතියම
  ලෝක සිතියම
- ඡායාරූප
  මිනිස්, සත්ත්ව, ශාඛා පින්තූර
  ආලෝක වස්තූන් පෙන්වන පින්තූර
  දිළිඳුන් පෙන්වන පින්තූර
  මේරි ජෝන්ස්ගේ පින්තූර
  තෝමස් චාර්ල්ස්ගේ පින්තූර
- දිනපතා පුවත්පත්
  දිළිඳුකම පිළිබඳ පුවත්
  දරුවන් හිංසාවට පත්වීම පිළිබඳ ලිපි
  කාන්තාවන් හිංසාවට ලක්වීම පිළිබඳ ලිපි
- ගීත
  කිතුනු ගීත
  බුදු තාත්තේ බොන්න එපා
- කාඩ්පත්
  ශු ලියවිලි සහිත කාඩ්පත්
  ස්වාමින්වහන්සේගේ යාච්ඤාව සහිත කාඩ්පත්
- CD පට
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය

## 7.2.3 ක්‍රියාකාරකම් සංතතිය

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | දේව ඇදහිල්ල පදනම් කරගනිමින් යහපත් ජීවිත ගත කරයි. |
| නිපුණතා මට්ටම 1.1 | : | ප්‍රාණීන්ට හිතකර පරිසරය තුළින් දේව ප්‍රේමයට සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 1.1 | : | "ජීවීන් සහිත පරිසරය තුළ දේව ප්‍රේමය අවබෝධ කරගෙන ඒ පිළිබඳව සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 40 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • බ්‍රිස්ල් බෝඩ්<br>• පාට පැන්සල්<br>• සත්ත්ව ලෝකයේ ජීවීන් සහිත පින්තූර (වීඩියෝ පටයක්)<br>• ඇමුණුම 1.1 හා 1.2<br>• බයිබලය |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1 :

- ප්‍රාණීන් (මිනිස්, සත්ත්ව, ශාක)ගේ පින්තූර දරුවන්ට පෙන්වා ඒ තුළින් එහි නිර්මාණ ස්වභාවය පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසන්න.
- පහත කරුණු විමසමින් සාකච්ජාව මෙහෙයවන්න.

| |
|---|
| • දෙවියන්වහන්සේ සියලු ජීවීන් මැවූ බව.<br>• මේ ලෝකයේ ජීවීන්ට හිතකර පරිසරයක් අපට දැකිය හැකි බව.<br>• සජීවී පරිසරය දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ප්‍රකාශන බව.<br>• අප මේ සජීවී පරිසරය ආරක්ෂා කළ යුතු බව. |

පියවර 1.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- 1.1 ඇමුණුම හා 1.2 ඇමුණුම, කඩදාසි, මාකර් පෑන්, ශිෂ්‍යයන් වෙත ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.3 : 

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
  විස්තාරණය සඳහා ප්‍රථම ඉදිරිපත් වූ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
  සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
  පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- දෙවියන්වහන්සේ ව්‍යාකූල පරිසරය (උත්පත්ති 1:1-2) ජීවීන්ට හිතකර පරිසරයක් බවට පත් කළ බව. (උත්පත්ති 1:9-10)
- ජීවීන්ගේ ජීවිත සැලැස්ම තුළ අපට දෙවියන්ව හන්සේගේ හැකියා අනාවරණය වන බව. ජෝබ් 38:24-38
- ජීවීන් තුළින් දේව ප්‍රේමය අනාවරණය වන බව.
- මේ ජීවීන් සිටින පරිසරය දේව ඇදහිල්ල තුළ අප වගකීමෙන් ආරක්ෂා කළ යුතු බව. ගීතාවලිය 65:6-9, 104:14

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ප්‍රාණීන් නම් කරයි.
- ජීවීන් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි.
- "ජීවීන් සාක්ෂි දරන්නේ දේව ප්‍රේමය හා දේව හැකියාව පිළිබඳවය". මෙය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
- වර්තමාන ව්‍යාකූල පරිසරය නිරවුල් පරිසරයකට පත් කරන්නේ කෙසේද? සාකච්ඡා කොට බෙදා ගනියි.

කණ්ඩායම් ගවේෂණස සඳහා උපදෙස්

ඇමුණුම 1.1.1

**සජීවී පරිසරය**

- දෙවියන්වහන්සේ ප්‍රාණීන් සිටින ව්‍යාකූල පරිසරය ව්‍යාකූල නොවන ප්‍රාණීන් සිටින පරිසරයකට පරිවර්තනය කරන ලදී. (උත්පත්ති 1:1-2/9 පද හා 10 පදය)

  දෙවියන්වහන්සේ සජීවී ලෝකය ක්‍රමානුකූලව සකස් කළ සේක. (ගීතාවලිය 65:6-9) දෙවියන්වහන්සේ මේ සියලු සජීවීන් පරිසරය තුළ එක්ව ජීවත් වීමට සැලසූ සේක. (ගීතාවලිය 104:14) මෙම සජීවී පරිසරය දේව ප්‍රේමය හා හැකියාව පෙන්නුම් කරයි. (ජෝබ් 38:24-38) අපද දෙවියන්වහන්සේ සමඟ එකතු වී මේ සජීවී පරිසරය ආරක්ෂා කර ගත යුතුය.

ඇමුණුම 1.1.2

පහත වගුව පුරවන්න

| සජීවී පරිසරය | සජීවී වාතාවරණය | අද ව්‍යාකූල පරිසරය | වෙනස් කිරීමට ගත හැකි පියවර |
|---|---|---|---|
| 1. පැල | • ශක්තිමත්ය.<br>• සජීවීව වැඩෙයි | • සෝදා පාලුව<br>• දූෂිත වායුව | • ශාඛා ජීවත්වීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීම<br>• පරිසර දූෂණය වැළැක්වීම |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | දේව ඇදහිල්ල පදනම් කර ගනිමින් යහපත් ජීවිතයක් ගත කරයි. |
| නිපුණතා මට්ටම 1.2 | : | සත්ත්ව ලෝකයේ යහපත් ගුණාංග අඛණ්ඩව චරිතායනය කරමින් දෙවියන්වහන්සේගේ ක්‍රමයට සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 1.2 | : | "සත්ත්ව ලෝකයේ යහපත් ගුණාංග අඛණ්ඩව චරිතායනය කරමින් දෙවියන්වහන්සේගේ ක්‍රමයට සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 40යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශු බයිබලය<br>• ඇමුණුම 1:2:1 හා 1:2:2<br>• මාකර් පෑන්<br>• ඩිමයි කඩදාසි<br>• ක්‍රියාශීලී කුහුඹුවන්/ශක්තිමත් ගවයකු ගේ පින්තූර හෝ වීඩියෝ පටයක් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.1 :

- මේ අදාළ පින්තූර හෝ වීඩියෝ පටය ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස් ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවට පිවිසෙන්න.

> - දෙවියන්වහන්සේ සත්ත්ව ලෝකය මැවූ බව. (උත්පත්ති 1:22-25)
> - සත්ත්ව ලෝකයේ සතුන් තුළ යහපත් ගුණාංග ඇති බව. උදා:කුහුඹුවන්ගේ කඩිසර බව.
> - සතුන්ගේ අයහපත් ගතිගුණ අප අනුගමනය කළ නොයුතු බව. උදා: නරියා - රැවටීම.
> - සත්ත්ව ලෝකයේ සතුන්ගේ යහපත් ගුණාංග අප අගය කළ යුතු බව.

පියවර 1.2.2 :

- සුදුසු පරිදි කණ්ඩායම් ගත කරන්න.
- ඇමුණුම 1:2:1 හා 1:2:2 ශු බයිබලය, ඩිමයි කඩදාසි, මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමටම ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.2.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- ප්‍රථම කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධන යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- සතුන්ගේ යහපත් ගතිගුණ දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා හැකියාවට සාක්ෂි දරන බව.
- සත්ත්ව ලෝකයේ පහත සඳහන් යහපත් ගුණාංග තුළින් දෙවියන්වහන්සේගේ කැමැත්ත හඳුනාගත හැකිබව.
  කුහුඹුවන් - කඩිසර බව (හිතෝපදේශ 6:6-8)
  ගවයන් - කෘෂිකර්ම කටයුතු කිරීම. (හිතෝපදේශ 6:6-8)
  බල්ලන් - ස්තුතිවන්තකම,
- සතුන් තුළින් දෙවියන්වහන්සේ මිනිසුන් රැක බලාගන්නා බව.
  මීහරකා - කුඹුරු වැඩ
  එළදෙන - කිරි
  බල්ලා - ආරක්ෂාව
- සත්ත්ව ලෝකය අප වගකීමෙන් ආරක්ෂා කරගත යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සත්ත්ව ලෝකය විස්තර කරයි.
- යහපත් ගුණාංග සහිත සතුන් නම් කර එම ගුණාංග ලැයිස්තු ගත කරයි.
- සතුන්ගේ ගතිගුණ මගින් දේව කැමැත්ත ප්‍රකාශ වන බව ස්ථිර කර ගනිමින් එය අන්‍යයන්ට ප්‍රකාශ කරයි.
- "සත්ත්ව ලෝකය ආරක්ෂා කිරීම අපගේ වගකීමයි." මේ පිළිබඳව පුවත්පතකට ලිපියක් ලියයි.

ඇමුණුම 1.2.1 : කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- දේව මැවීම තුළ සත්ත්ව ලෝකය ඉතා වැදගත් වේ. සතුන් දෙවියන්වහන්සේගේ හැකියාව හා ප්‍රේමය තම යහපත් ගුණාංග තුළින් පෙන්නුම් කරනු ලබයි. (හිතෝපදේශ 6:6-8, 14:14) මනුෂ්‍යයන් තම ජීවිත අවශ්‍යතා වෙනුවෙන් සතුන්ගෙන් යැපීම සිදුවේ. විශේෂයෙන්ම "කිරි (එළදෙන)" "ඇඳුම් (බැටලුවන්)" "ආදායම (එළුවන්, බැටළුවන්)" - මේ නිසා මනුෂ්‍යයන් මේ සත්ත්ව ලෝකය ආරක්ෂා කොට බලා ගැනීම යුතුකමකි.

ඇමුණුම 1.2.2

1. දේව මැවිල්ල තුළ සත්ත්ව ලෝකයේ වැදගත්කම බයිබල් පද වලින් උපුටා දක්වන්න.
2. කුහුඹුවකු දෙස බලා උගේ ක්‍රියා කලාපය ඇගයීමට ලක්කොට එය අන්‍යයන්ට ප්‍රකාශ කරන්න.
3. "දේව ප්‍රේමය හා හැකියාව සතුන්ගේ ගුණාංග වලින් ප්‍රදර්ශනය වේ.". මේ පිළිබඳව සඳහන් කරමින් මිතුරකුට ලිපියක් ලියන්න.
4. සතුන්ගේ යහපත් ගුණාංග ලැයිස්තු ගතකරමින් එය මනුෂ්‍යයන්ගේ ජීවිත වලට මග පෙන්වීමක් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | දේව ඇදහිල්ල පදනම් කර ගනිමින් යහපත් ජීවිතයක් ගත කරයි. |
| නිපුණතා මට්ටම 1.3 | : | ආලෝක වස්තු වලින් දේව ප්‍රේමය ගැන සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 1.3 | : | "ආලෝක වස්තු වලින් ඇති ප්‍රයෝජන දකිමින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය ගැන සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 40 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • බයිබලය<br>• ආලෝක වස්තූන් පිළිබඳ පින්තූරයක්<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන්<br>• ඇමුණුම 1:3:1 හා 1:3:2 |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.3.1 :

- ආලෝක වස්තූන් පිළිබඳ පින්තූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- මෙම පින්තූරය ආශ්‍රයෙන් පහත කරුණු මතු කරමින්

1. ආලෝක වස්තු මනුෂ්‍යයන් වෙත ඇති දේව ප්‍රේමය ප්‍රකාශ කරන බව.
2. දෙවියන්වහන්සේ ආලෝක වස්තු මගින් ජීවීන් ශක්තිමත් කරවන බව.
3. මනුෂ්‍යයන්ගේ වගකීම වන්නේ දෙවියන්වහන්සේ සමඟ එකතුව ආලෝක වස්තූන් ආරක්ෂා කිරීම බව.
   ආලෝක වස්තූන් අදාළ ආකාරයට ආරක්ෂා කර බලා ගත යුතු බව.

සාකච්ඡාවට පිවිසෙන්න.

පියවර 1.3.2 :

- සුදුසු පරිදි කුඩා කණ්ඩායම් වෙන් කරන්න.
- ඇමුණුම 1.3.1 හා 1.3.2, ඩිමයි කඩදාසි, මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට එය ඉදිරිපත් කරවන්න.

- ආලෝක වස්තූන් දේව මැවිල්ල බව
- ජීවත්වීම සඳහා උපකාරී වීමට ආලෝක වස්තූන් මැවූ බව. උත්පත්ති 1:14-19, ගීතාවලිය 136:7-9
- පරිසර දූෂණය වැළැක්වීමෙන් ආලෝක වස්තූන් ආරක්ෂා කරගත යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ආලෝක වස්තු නම් කරයි.
- ආලෝක වස්තූන් ආරක්ෂා කොට බලා ගැනීමට ඉදිරිපත් වෙයි.
- දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා හැකියාව ආලෝක වස්තු තුළින් දැකිය හැකි බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- ආලෝක වස්තූන් වලට ගරු කරමින් දෙවියන්වහන්සේට ඒ ගැන ස්තුති කරමින් යාච්ඤාවක් කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

ඇමුණුම 1.3.1

මැවීම තුළ ආලෝක වස්තූන් වැදගත් ස්ථානයක් ගනියි. දෙවියන්වහන්සේ මෙම ආලෝක වස්තු රැකගැනීම හා ඒ තුළින් පරිසරය සමතුලිතව පවත්වා ගැනීම තුළින් ජීවීන් හා මනුෂ්‍යයාට යහපතක් සලසනු ලැබේ. මෙම ආලෝක වස්තු තුළින් දේව ප්‍රේමය හා හැකියාව හඳුනා ගත හැකිය. ඒ නිසාම ආලෝක වස්තු රැකගත යුතුය.

ඇමුණුම 1.3.2

පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

කණ්ඩායම් 1 - ආලෝක වස්තු දේව මැවිල්ලකි.

කණ්ඩායම් 2 - ආලෝක වස්තූන් මනුෂ්‍යයන් ජීවත් කරවයි.

කණ්ඩායම් 3 - දේව ප්‍රේමය හා හැකියාව ආලෝක වස්තු තුළින් ප්‍රදර්ශනය වේ.

කණ්ඩායම් 4 - දෙවියන්වහන්සේ තුළ යුතුකමක් ලෙස අප ආලෝක වස්තු රැකබලා ගත යුතුය.

| | | |
|---|---|---|
| නිපුණතාව 1:0 | : | දේව ඇදහිල්ල පදනම් කරගනිමින් යහපත් ජීවිතයක් ගත කරයි. |
| නිපුණතා මට්ටම 1.4 | : | සාගර සම්පත් හා ජල සම්පත් තුළින් දේව ප්‍රේමය ප්‍රකාශ කරයි. |
| ක්‍රියාකාරකම 1.4 | : | "සාගර සම්පත් හා ජල සම්පත් වල ප්‍රයෝජන තුළින් දේව ප්‍රේමයට සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 40 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • සාගර හා ජල සම්පත් සහිත පින්තූරයක් හෝ වීඩියෝ පටයක්<br>• බයිබලය<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.4.1 :

- පින්තූරය හෝ වීඩියෝ පටය ශිෂ්‍යයන්ට පෙන්වා අදහස් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- මෙම පින්තූරය ආශ්‍රයෙන් පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - දෙවියන්වහන්සේ සාගර හා ජල සම්පත් මැවූ බව (උත්පත්ති 1:10).
> - සාගර හා ජල සම්පත් මනුෂ්‍යයන්ට උපකාර කරන බව.
> - සාගර හා ජල සම්පත් සියලු ජීවීන්ට උපකාරයක් බව.
> - ජලය අපතේ නොහැරිය යුතු බව.

පියවර 1.4.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 1.4.1 හා 1.4.2, බයිබලය, මාකර් පෑන්, හා ඩිමයි කඩදාසි ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 1.4.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- ප්‍රථම කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථා ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධන යෝජනා ලබා ගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- සාගර හා ජල සම්පත් මනුෂ්‍ය ජීවිතයට ඉතා වැදගත් බව.
- දේව ප්‍රේමය හා හැකියාව මේ තුළින් ප්‍රදර්ශනය කරන බව (උත්පත්ති 1:10, ගීතාවලිය 104:24-26).
- මිනිසා සාගර හා ජල සම්පත වගකීමෙන් භාවිතා කළ යුතු බව.
- සාගර හා ජල සම්පත සම්පතක් බව හඳුනාගෙන ඉදිරියට එය ආරක්ෂා කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :
- ජල සම්පත් නම් කරයි.
- ජල සම්පත නිසි ලෙස ආරක්ෂා කර ගනිමින් ප්‍රයෝජනයට ගැනීමට ඉදිරිපත් වෙයි.
- දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා හැකියාව සාගර හා ජල සම්පත් තුළින් ප්‍රදර්ශනය වන බව පිළිගෙන එය ප්‍රකාශ කරයි.
- "ජල සම්පත දූෂ්‍ය වන ආකාරය හා එය දූෂණය වීම වැළකිය හැකි ක්‍රම" අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කර ඒ පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 1.4.1

- දෙවියන්වහන්සේ සාගර හා ජල සම්පත මැවූ සේක. (උත්පත්ති 1:1-10, ගීතාවලිය 104:24-26). මේ මගින් මනුෂ්‍යයා ජීවත් කරවයි. එසේම සාගර හා ජල සම්පත් තුළින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා නිර්මාණශීලී හැකියාව ප්‍රදර්ශනය වේ.

- සාගර හා ජල සම්පත වගකීමෙන් ආරක්ෂා කර බලා ගැනීම මනුෂ්‍යයන්ගේ වගකීමයි. අද ජල සම්පත විවිධාකාරයෙන් දූෂණය වේ. නාස්ති වේ. මේ තත්ත්වය තේරුම් ගෙන ජලය ආරක්ෂිතව හා නාස්ති නොකර, අදාළ ආකාරයට භාවිතා කළ යුතුය.

ඇමුණුම 1.4.2

පහත ලැයිස්තුව සම්පූර්ණ කරන්න.

| ජල සම්පත | නිර්මාණය | ප්‍රයෝජන | අද ලෝකයේ ජල සම්පත් තත්ත්වය | භාවිතයට ගැනීම හා ආරක්ෂා කිරීමට ගත හැකි පියවර |
|---|---|---|---|---|
| 1. සාගරය | දෙවියන්වහන්සේ | මනුෂ්‍යයන්ට හා ජීවීන්ට | දූෂණය වූ තත්ත්වය | අපද්‍රව්‍ය සාගරයට නොදැමීම |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | දේව ඇදහිල්ල පදනම් කරගනිමින් යහපත් ජීවිතයක් ගත කරයි. |
| නිපුණතා මට්ටම 1.5 | : | දෙවියන්වහන්සේ මිනිසා සමඟ බවට සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 1.5 | : | "මැවීම තුළ දේව ප්‍රේමය හඳුනාගෙන දෙවියන්වහන්සේ අප සමඟ බව සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 40 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 1.5.1 හා 1.5.2<br>• ඩිමයි කඩදාසි හා මාකර් පෑන්<br>• බයිබලය |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.5.1 :

- "දෙවියන්වහන්සේ මැවිල්ලට ආදරය කරන සේක", "දෙවියන්වහන්සේ අප සමඟය" යන කරුණු ශිෂ්‍යයන්ගෙන් සාකච්ඡා කර ලබාගන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • දේව ස්වරූපයෙන් (දේව ගුණාංග සහිතව) මිනිසා මවා ඇති බව.<br>• දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා හැකියාව මැවීම තුළ ින් ප්‍රකාශ වන බව.<br>• මැවීම තුළින් දෙවියන්වහන්සේ ලෝකයාට ප්‍රේම කරන බව.<br>• දෙවියන්වහන්සේ ජීවමානව අප සමඟ සිටින බව.<br>• දෙවියන්වහන්සේ සමඟ ජීවත් වෙමින් එතුමාණන්ගේ ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් වගකීමෙන් යුතුව මැවිල්ල ආරක්ෂා කර රැකබලාගත යුතු බව. |

පියවර 1.5.2 :

- සුදුසු පරිදි කණ්ඩායම් බෙදන්න.
- ඇමුණුම 1.5.1 හා 1.5.2, ඩිමයි කඩදාසි, මාකර් පෑන්, බෙදා දෙන්න
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 1.5.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරන්න.
- ප්‍රථම කණ්ඩායම් වලට ප්‍රථම ස්ථාන ඉදිරිපත් කිරීමට දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- සෑම ජීවියෙක්ම තම ජීවිතය තුළින්ම දේව ප්‍රේමයට සාක්ෂි කරන බව.
- දෙවියන්වහන්සේ මිනිසා සමඟ බවට මිනිසා සාක්ෂි දරන බව. ගීතාවලිය 121, මතෙව් 1:23, යෙසායා 7:14
- අප මැවිල්ල ආරක්ෂා කර රැකබලා ගැනීම තුළින් දෙවියන්වහන්සේ අප සමඟ ජීවත් වන බව ස්ථිර කරන බව.

- දේව තක්සේරුව හා ඇගයීම් නිර්ණායක : ප්‍රේමය හා නිර්මාණශීලී හැකියාව දේව මැවිල්ල තුළින් දකින්නේ කෙසේද යන්න පැහැදිලි කරයි.
- "දෙවියන්වහන්සේ අප සමඟය" යන්න ස්ථිර කර එම අදහස අන් අය සමඟ බෙදා ගනියි
- දේව මැවිල්ල වගකීමෙන් ආරක්ෂා කර රැක බලාගැනීමට අපට කළ හැකි දෑ පිළිබඳ, අදාළ පුද්ගලයන් හමුවී තොරතුරු ලබාගෙන, කළ හැකි දෑ විස්තර කරයි.

කණ්ඩායම් ගවේෂණ සඳහා උපදෙස්

ඇමුණුම 1.5.1

- පහත ඡේද කියවා ඇමුණුම 1.5.2 අනුව වාදයක් පවත්වන්න. දෙවියන්වහන්සේ ලෝකය හා සියලු දේ, විශේෂයෙන් මනුෂ්‍යයන්ද මැවූ සේක. (උත්පත්ති 1:2) දෙවියන්වහන්සේ තුළ වූ ප්‍රේමය හා හැකියාව අපට ඒ තුළින් හෙළිදරව් වේ.

- දෙවියන්වහන්සේගේ මැවීම පමණක් නොව එතුමා අප සමඟ ජීවත්වන බවද අප හඳුනාගත යුතුය. අද අපගේ අත්දැකීම් තුළින් එය අපට ස්ථිර කරයි. අප මෙම ලෝකය වගකීමෙන් හා සැලකිල්ලෙන් ආරක්ෂා කරගත යුතුය. අපගේ ආත්මාර්ථකාමීත්වය නිසා අප එය විනාශ නොකළ යුතුය. අප අපගේ විශ්වයේ සම්පත් ගැන සැලකිලිමත් විය යුත්තේ එම සම්පත් තුළින් සියලුම ජීවීන් යැපෙන නිසාය.

ඇමුණුම 1.5.2

කණ්ඩායම් අතර විවාදයක් පවත්වන්න

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | - | ) මැවිල්ල තුළ දේව ප්‍රේමය අත්දැකිය හැක/නිර්මාණශීලීත්වය අත්දැකිය හැක. |
| 2 කණ්ඩායම | - | ) |
| 3 කණ්ඩායම | - | මිනිසා වගකීමෙන් මැවිල්ල ආරක්ෂා කරයි/නොකරයි |
| 4 කණ්ඩායම | - | මැවිල්ල මනුෂ්‍යයන් විනාශ කරයි<br>මනුෂ්‍යයන් මැවිල්ල විනාශ කරයි |

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි. |
| නිපුණතා මට්ටම 2.1 | : | එලියා දෙවියන්වහන්සේගේ දේව බලය ගැන සාක්ෂි දරන්නාක් මෙන් ජේසුස්වහන්සේගේ ගතිගුණ පිළිබඳ සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 2.1 | : | "ජේසුස්වහන්සේගේ දිරිමත් කිරීම පිළිබඳ සාක්ෂි දරමු." |
| කාලය | : | විනාඩි 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ඩිමයි කොළ, මාකර් පෑන්<br>• ඇමුණුම 2.1.1 හා 2.1.2<br>• එළියාගේ පින්තූරය<br>• බයිබලය |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.1 :

- ගැටුම්කාරී තත්ත්වයක් මැද දෙවියන්වහන්සේ එලියා ශක්තිමත් කළ බව පිළිබඳව දරුවන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - එලියා යහපත් සාරධර්මයන්ගෙන් යුතුව ජීවත් වූ බව.
>   යුක්තිය - 1 රාජාවලිය 21 (නාබොත්)
>   කරුණාව - 1 රාජාවලිය 17:8-23 (වැන්දඹුව)
> - දිවැසිවර සේවය අනුව ගැටුම්කාරී තත්ත්වය මැද කම්පනයට පත්ව සිටියදී දෙවියන්වහන්සේ එලියා ශක්තිමත් කළ බව. 1 රාජාවලිය 19:17
> - අපට ශක්තිය දෙන්නේ දෙවියන්වහන්සේ බව
> - අප අන්‍යයන් ශක්තිමත් කළ යුතු බව.

පියවර 2.1.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට බෙදන්න.
- ඇමුණුම 2.1.1 හා 2.1.2, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

විනාඩි 30

පියවර 2.1.2 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමටම ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ජේසුස්වහන්සේගේ යහපත් ගුණාංග මගින් (එලියාගේ) මිනිසා ජීවත් කළ යුතු බව.
  යුක්තිය : මතෙව් 5:6-10
  කරුණාව : මතෙව් 5:7
  සාමය : මතෙව් 5:9
- ගැටුම්කාරී තත්ත්වයක් තුළ අරගලයේ යෙදෙන අයට ජේසුස්වහන්සේගේ මෙම ගුණාංග උපකාර වන බව.
- දිගුකාලීනව එක් දෙයකට ලතවීමෙන් යහපතක් නොවන බව. මතෙව් 6:25-34
  ගැටුම්කාරී තත්ත්වයකට
  මුහුණ පෑමට දිරිය. මතෙව් 26:39
- ගැටුම්කාරී ප්‍රචණ්ඩත්වයට මුහුණ දිය යුතු බව. ලූක් 9:54
- ක්‍රිස්තුස්වහන්සේගේ යහපත් ගුණාංග අනුගමනය කිරීමෙන් අපි ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දිය යුතු බව.

විනාඩි 40යි

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ජේසුස්වහන්සේගේ යහපත් ගුණාංග, ධෛර්යය හා ශක්තිය ගෙන දෙන බව බයිබල් කොටස් ඇසුරින් පැහැදිලි කරයි.
- ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දීමට ප්‍රචණ්ඩත්වය යොදා නොගත යුතු බව සාකච්ඡා කර පිළිගෙන අන් අය සමඟ බෙදා ගනියි.
- ජේසුස්වහන්සේගේ ගුණාංග මගින් සමාජය ශක්තිමත් වන බව ඉදිරිපත් කරයි.
- ජේසුස්වහන්සේගේ ගුණාංග මගින් ලබාදෙන ධෛර්යය මත ජීවත් වීමට තීරණය කරයි.

ඇමුණුම 2.1.1

- දේව ගුණාංග මගින් එම ගුණාංග සහිත අයකු ලෙස අප පරිවර්තනය විය යුතුය. විශේෂයෙන්ම ජේසුස්වහන්සේ එම ගුණාංග සහිතව ධෛර්යයෙන් යුතුව මෙම ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දුන්නා සේම අප ද ක්‍රියා කළ යුතුය. යුක්තිය, කරුණාව හා සාමය ජේසුස්වහන්සේ වර්ධනය කළ සේක. (මතෙව් 5:6-10) ළතැවිල්ලෙන් කල් යැවීම තුළින් කිසිදු යහපතක් නොවේ. මතෙව් 6:25-34. අප ධෛර්යයෙන් ප්‍රශ්න වලට මුහුණ දිය යුතුය.

- මුහුණ දීමට නොහැකි ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දීමට දෙවියන්වහන්සේ එළියාට ධෛර්යය දුන් සේක. එළියා දිවැසිවර මෙහෙයේ යෙදුනේ යුක්තිය හා කරුණාව වැනි ගුණාංග තුළිනි. (1 රාජාවලිය 17, 19, 21 පරිච්ඡේද) එළියාව දෙවියන්වහන්සේ ශක්තිමත් කළාක් මෙන් දේව ගුණාංග තුළින් අපි ශක්තිය ලබමු.

ඇමුණුම 2.1.2

අප දෙවියන්වහන්සේගේ ශක්තිය තුළින් ගැටුම්කාරී පරිසරය තුළ කෙසේ ජීවත් විය යුතුද යනුවෙන් සාකච්ඡා කර පහත වගුව පුරවන්න.

| ගැටුම්කාරී පරිසරය | දෙවියන්වහන්සේගේ ගුණාංග මගින් ශක්තිය ලත් පුද්ගලයෙකුගේ ක්‍රියාව |
|---|---|
| 1. හදිසි අනතුරක් | |
| 2. සමීපතම ඥාතියෙකුගේ මරණය | |
| 3. හොඳම මිතුරෙකුගේ අසනීපය | |
| 4. සුනාමි අවස්ථාවකදී ජීවත් වුවහොත් | |

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි. |
| නිපුණතා මට්ටම 2.2 | : | දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව පාලුකරයේ සංරක්ෂණය කළාක් මෙන් අද ජේසුස්වහන්සේගේ ගුණාංග තුළින් ලබන සංරක්ෂණය පිළිබඳව සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 2.2 | : | "ජේසුස්වහන්සේගේ සංරක්ෂණය පිළිබඳ සාක්ෂි දරමු." |
| කාලය | : | මිනිත්තු 80 යි |

ගුණාත්මක යෙදවුම් :

- බයිබලය
- ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඉශ්‍රායෙල් ජනතාව මිසරයෙන් පලා එන පින්තූරයක්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.1 :

- ඉශ්‍රායෙල් ජනතාව මිසරයෙන් ගළවා ගෙන පැමිණීමේ විමුක්ති ගමන තුළ සංරක්ෂණය කළ ආකාරය පිළිබඳ කරුණු දැක්වීමට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ජාව මෙහෙයවන්න.

> - ඉශ්‍රායෙල් සිට කානාන් දක්වා විමුක්ති ගමන තුළ ඔවුන්ව දෙවියන්වහන්සේ රැකබලා ගත් බව.
>   ආහාර - නික්මයාම 16:4-35
>   ජලය - නික්මයාම 17:1-6
>   රැකබලාගැනීම - ගීතාවලිය 105:39-41
> - දෙවියන්වහන්සේගේ රැකබලා ගැනීම පිළිබඳව ස්තුතිවන්තව ජීවත්වීම අවශ්‍ය බව.

පියවර 2.2.2 :

- පන්තිය කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.3.1 හා 2.3.2, ඩිමයි කොළ හා මාකර් පෑන් ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.2.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- පළමු ඉදිරිපත් වන කණ්ඩායම් වලට මුල් තැන දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේ රැක බලා ගන්නා බව. ගීතාවලිය 109:39-41
- දෙවියන්වහන්සේගේ ගුණාංග මගින් අපව රැකබලා ගන්නා බව.
    - දෙවියන්වහන්සේ තම ජීවිතය පවා මනුෂ්‍යත්වය තුළින් බෙදා ගත් බව .
      ජොහන් 1:1-15
      පිලිප්පි 2:6-11
    - ජීවිතය නපුරෙන් ගළවා පිරිසිදු කළ බව.
      ජොහන් 13:2-22
    - යහපත් නායකත්වය, බෙදාගත යුතු බව.
      මාර්ක් 6:22-44
- ජේසුස්වහන්සේ මෙන් අපද අන් අයව රැකබලා ගත යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ජේසුස්වහන්සේගේ ප්‍රධාන ගුණාංගය වන්නේ රැකබලා ගැනීම බව බයිබල් පද මගින් විස්තර කරයි.
- ඉශ්‍රායෙල්වරුන්ගේ ඓතිහාසික විමුක්ති ගමන තුළ ඔවුන්ට අවශ්‍යතාවයක් ඇති වූ විට පමණක් දෙවියන්වහන්සේ ඔවුනට සපයා දුන් බව තහවුරු කර ප්‍රකාශ කරයි.
- සමාජ සුභසාධනය මිස ආත්මාර්ථකාමිත්වය උදෙසා සංරක්ෂණය සිදු නොකළ යුතු බව පැහැදිළි කරයි.
- ජේසුස්වහන්සේ මෙන් අනෙක් අය රැකබලා ගැනීමට ස්වයං තීරණයක් ගනියි.

ඇමුණුම 2.2.1

- ජේසුස්වහන්සේගේ ගතිගුණ අනුව ජීවත් වීමට තීරණයක් ගෙන ක්‍රියාකිරීම ඉතා වැදගත්ය. විශේෂයෙන් ජේසුස්වහන්සේ මනුෂ්‍යයන් රැකබලාගත් සේක. ජේසුස්වහන්සේ තම ජීවිතය සම්පූර්ණයෙන්ම පූජා කලේ මනුෂ්‍යයා ගළවා ගැනීම සඳහාය. නපුර පරාජය කිරීමටය. උන්වහන්සේ යහපත් නායකත්වය නැති අයට යහපත් නායකත්වයක් ගොඩ නගා ගැනීමට උපකාර කළ සේක. ජේසුස්වහන්සේගේ ඉගැන්වීම්, ක්‍රියාකාරීත්වය හා ජීවිත රටාව මනුෂ්‍යත්වය යහපත් මාර්ගයකට යොමු කෙරුණි. ජේසුස්වහන්සේ අපව රැකබලා ගත්තා සේම, අද රැක බලා ගන්නා සේම, අපද එවැනි ජීවිත ගත කිරීම සඳහා එනම් අන්‍යයන් රැක බලාගැනීම සඳහා ජේසුස්වහන්සේ අපව යොමු කරවන සේක.

- ඉශ්‍රායෙල් ජනතාව දේව සැපයීම තුළ ජීවත්වූහ. දෙවියන්වහන්සේ වහල්කමින් ඉශ්‍රායෙල් සෙනඟ මුදා ගත් සේම, ඔවුන්ව ඒ ඉශ්‍රායෙල්වරුන්ගේ විමුක්තිදායක ගමන තුළ රැකබලා ගත්සේක. ආහාර, ජලය, රැකවරණය සහ මග පෙන්වීම ලබා දෙමින් ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කළ සේක. දෙවියන්වහන්සේ එදා ඉශ්‍රායෙල් සෙනගට සැපයූවාක් මෙන් අපි ජේසුස්වහන්සේ තුළින් වර්තමානයේදී දෙවියන්වහන්සේගේ සැපයීම අත් දකිමු.

- අපගේ ජීවිත ජේසුස්වහන්සේගේ ජීවිතය සේ අනිත් අයගේ ජීවිත රැකබලාගන්නා ජීවිත විය යුතුය. ඒ මගින් අපගේ ජීවිතයට අරුතක් ඇති කරවයි.

ඇමුණුම 2.2.2.

දෙවියන්වහන්සේගේ යැපීම අත්දකින ආකාරය හා පහත අවස්ථාවන්හීදී අප විසින් අනිත් අය රැකබලා ගන්නා ආකාරයද දක්වන්න.

| අවස්ථාව හා පරිසරය | දෙවියන්වහන්සේගේ යැපීම අත්දැකීම | අන් අය රැකබලා ගන්නා ආකාරය |
|---|---|---|
| රෝගී තත්ත්වය | | |
| ඥාති මරණ | | |
| යුද්ධය | | |
| දුක් විඳීම/කලකිරීම ඇති අයෙක් | | |
| දුගී බව | | |

නිපුණතාව 2.0 : ජේසුස් වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි.

නිපුණතා මට්ටම 2.3 : ඉශ්‍රායෙල් ජනතාව පීඩනයට පත් කළ අයගෙන් ඔවුන් රතු මුහුදේදී බේරාගත්තාක් මෙන් ජේසුස්වහන්සේගේ ගුණාංග මගින් අද අප ආරක්ෂා කරනු ලැබීම පිළිබඳව සාක්ෂි දරයි.

ක්‍රියාකාරකම 2.3 : "දෙවියන්වහන්සේ ගුණාංග තුළින් අප ආරක්ෂා වන බවට සාක්ෂි දරමු."

කාලය : මිනිත්තු 80යි.

ගුණාත්මක යෙදවුම් :
- බයිබලය
- ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 2.3.1 හා 2.3.2

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.3.1 :
- දෙවියන්වහන්සේ රතු මුහුද දෙබෑ කර ඉශ්‍රායෙල්වරුන් මුදාගැනීම පිළිබඳ අදහස් ශිෂ්‍යයන්ට දැක්වීමට සලස්වයි.

- දෙවියන්වහන්සේ මනුෂ්‍යයකු ලෙස ජීවත් වූ බව.
- මනුෂ්‍යයන්ගේ ගැටුම්කාරී හා භයානක අවස්ථාවක ඔවුන් දෙවියන්වහන්සේට හඬ ගැසූ බව.
- ඉතිහාසය තුළ මනුෂ්‍යයන් අන්තරායකාරී අවස්ථාවකට මැදි වූ විට දෙවියන්වහන්සේ මැදිහත් වූ බව.
  උදා: රතු මුහුද තරණය (නික්මයාම 14:15-31)
- දෙවියන්වහන්සේ අද භයානක අවස්ථාවකට මුහුණ දෙන මනුෂ්‍යයා උදෙසා මැදිහත් වන බව.

- පහත කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

පියවර 2.3.2 :
- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.3.1 හා 2.3.2. ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්යය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයක **යොද-**

- භයානක අන්තරාකාරී අවස්ථාවක දෙවියන්වහන්සේ මනුෂ්‍යත්වයටම මග පෙන්වන බව.
- ජේසුස්වහන්සේ මනුෂ්‍යයන් ආරක්ෂා කරන බව.
- ඉගැන්වීම්, ක්‍රියාකාරිත්වය හා ජීවන ශෛලීය තුළින් මාර්ක් 14:32-42, යථාර්ථයට මුහුණ දීය හැකි බව.
- මාර්ක් 9:2-14 ආත්මාර්ථකාමී ආරක්ෂාව නොව අනුන් වෙනුවෙන් සේවය කිරීමෙහි වැදගත්කම ඇති බව.
- මාර්ක් 5:35-41 - මරණය මධ්‍යයෙහි පවා බලාපොරොත්තුව ඇති බව.
- අප ජීවත් වුවත්, ජීවිතයෙන් ඉවත් වුවත් (මරණය) ජේසුස්වහන්සේ උදෙසා ක්‍රියා කළ යුතු බව. 2 කොරින්ති 5:9
- ජේසුස්වහන්සේ අපව ආරක්ෂා කළාක් මෙන්, එතුමා බලාපොරොත්තු වූවාක් මෙන් අප අනෙක් අය ආරක්ෂා කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- අප එදිනෙදා මුහුණ දෙන අනතුරු නම් කරයි.
- අනතුරු වලට මුහුණ දීමේදී දෙවියන්වහන්සේගේ කරුණාව, ආරක්ෂාව හා මග පෙන්වීම ලබන බව, වටහාගෙන පැහැදිලි කරයි.
- අප අනතුරු වලට මුහුණ දෙන විට එය දේව අභිප්‍රාය අනුව මුහුණ දෙනවාද? නැතහොත් අපගේ ආත්මාර්ථකාමිත්වය නිසා එයට මුහුණ දෙනවාද යන්න අදාළ පුද්ගලයන් සමඟ සාකච්ඡා කර තීරණය කොට පැහැදිලි කරයි.
- මනුෂ්‍යත්වය රැකෙනුයේ අප අපව ආරක්ෂා කරගන්නා විටද? අප අනෙක් අය ආරක්ෂා කරන විටද යන්න තීරණය කොට ප්‍රකාශ කරයි.

ඇමුණුම 2.3.1

- මනුෂ්‍යත්වය දේව නිමැවුමකි. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට ජීවත් වන්නට සලස්වන්නේ සබඳතාවයන් මගිනී. බොහෝ මනුෂ්‍යයන් අනතුරු වලට මුහුණ දෙන්නේ මිනිසාගේ නපුරු අදහස් නිසාත්, බෙදා නොගැනීම නිසාත්, පීඩාවට පත් කිරීම නිසාත්, ආත්මාර්ථකාමිත්වය නිසාත් ය. විශේෂයෙන්ම ඉශ්‍රායෙල්වරුන් අනතුරුවලට ලක්වූයේ මිසරවැසියන්ගේ පීඩනය නිසාය.

- මේ පීඩා වලට ලක්වීමේදී දෙවියන්වහන්සේ තම කරුණාව ලබා දෙනසේක. විවිධ අනතුරු වාතාවරණයන් මැදදී දෙවියන්වහන්සේ ආරක්ෂාව ලබා දෙන සේක. නමුත් අප ජීවත් වුවත්, මරණයට පත් වුවත් එය දෙවියන්වහන්සේ තුළ ජීවත් වීමකි.

- දෙවියන්වහන්සේගේ ගළවා ගැනීමේ ක්‍රියාදාමය ආත්මාර්ථකාමිත්වය අභිභවා පරාර්ථකාමිත්වය නිසා සිදුවන්නකි. දෙවියන්වහන්සේගේ අභිප්‍රාය වූයේ දෙවියන්වහන්සේ මැවූ සියල්ල හා සියල්ලන් ජීවත් කරවීමය. ජීවත්වීම සැමගේ අයිතියකි. නමුත් මිනිසා අනතුරු ඇතිකරන විට එයට දේව මග පෙන්වීමෙන් හා දේව කරුණාවෙන් මුහුණ දීම සිදුවිය යුතුය.

ඇමුණුම 2.3.2

- විවාදයක් පවත්වන්න.
- දෙවියන්වහන්සේ අනතුරු වලින් මනුෂ්‍යත්වය ආරක්ෂා කරයි/නොකරයි.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි. |
| නිපුණතා මට්ටම 2.4 | : | ජේසුස්වහන්සේගේ කරුණාවෙන් නොපසුබටව නොසැලී සිටියි. |
| ක්‍රියාකාරකම 2.4 | : | "ජේසුස්වහන්සේ දෙන නව පිබිදීමට සාක්ෂිකාරයෝ වෙමු". |
| කාලය | : | මිනිත්තු 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශු බයිබලයේ මාර්ක් 6:45-52 |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.4.1 :

- ක්‍රිස්තුස්වහන්සේ ලබාදුන් නව පිබිදීම පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් සිසුන්ට ලබාදෙන්න.
- ඒ පිළිබඳ අදහස් විමසීමට ලක් කරන්න.
- පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - දේව අභිප්‍රාය වන්නේ මිනිසා හැම අතින්ම යහපත් ලෙස ජීවත්වීම බව.
> - මිනිසාගේ වගකීමෙන් තොර ක්‍රියා කලාපය නිසා බොහෝ දෙනෙකු අක්‍රීය වන බව.
> - මිනිසුන් අක්‍රීය වන විට දෙවිඳුන් ඔවුන් පුබුදුවා ලන බව. මාර්ක් 6:45-52, යෙසායා 11:1
> - අක්‍රීය අය පුබුදුවාලිය යුතු බව.

පියවර 2.4.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.4.1 හී ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.4.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- ජේසුස්වහන්සේ නපුර පරාජය කිරීමට ක්‍රියා කළ බව.
- නපුර මිනිසාට වේදනාව හා කලකිරීම උරුම කළත් එම තත්ත්වයන්ට මුහුණ පා ඊට මුහුණ දෙන අය පුබුදුවාලීම වැදගත් බව.
- කලකිරීමට පත්වූවන් පුබුදුවා ලීමට පෞද්ගලිකව හා සාමූහිකව කටයුතු කළ යුතු බව.

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :

- ඉදිනෙදා ජීවිතයේ කලකිරීමට මුහුණ පාන අවස්ථා නම් කරයි.
- කලකිරීමෙන් මිදී නව ජීවිතයකට පා තැබීමට පිහිට ඉල්ලා කරන යාච්ඤාවක් ලියයි.
- නපුර පරාජය කිරීමේ සටන නොනවත්වාම කළ යුතු බව සාකච්ඡා කොට ස්ථිර කරයි.
- පිබිදීම දේව තිළිණයක් බව ස්ථිර කොට අන්‍යයන් සමඟ බෙදා ගනියි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.4.1 :

- නපුර නිසා ඇතිවන වේදනාව, කලකිරීම හා අක්‍රීය බව අද සමාජයේ ජීවන රටාව වී ඇත. දුෂ්ටයන් ලෙස සැලකිය හැකි කීප දෙනෙකුගේ සිතුවිලි හා ක්‍රියා කලාපයන් නිසා බොහෝ යහපත් ජනයාට වේදනාව අත්විඳින්ට සිදුවී ඇත. එහෙත් බයිබලයට අනුව පැහැදිලි වන්නේ නපුරට විරුද්ධව සටන් කිරීම සඳහා දෙවිඳුන් යහපැවැත්ම ප්‍රබෝධමත් කරන බවයි.
- දේව රාජ්‍යත්වය තුළ නපුරට ඉඩක් නැත. එළිදරව් 21:1-5 නපුර සුණු විසුණු කර දමා යහපත ප්‍රාණවත් කළ හැකිය. එසේම මුහුද සම්පත් ලබාදෙන තැනක් බව අමතක නොකළ යුතුය.
- ආත්මාර්ථයෙන් තොරව කටයුතු කොට මානව විමුක්තිය සඳහා ක්‍රියාකරන විට නපුර පාලනය වේ. යුගයේ අවශ්‍යතාවය වන්නේ පෞද්ගලිකව හා සාමූහිකව ජේසුස් වහන්සේගේ මෙහෙවරෙහි නියැලීමය. ඒ මගින් කලකිරීමට පත් අයට සහනය ලබාදිය හැකිය.

ඇමුණුම 2.4.2 :

- කථික තරඟයක් පවත්වන්න.

  මාතෘකා - 1. නපුරට විරුද්ධ මිනිසාගේ සටන.

  2. නව ජීවනය සමඟ දේව කරුණාව පවතී.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි. |
| නිපුණතා මට්ටම 2.5 | : | කඩවුණු බලාපොරොත්තු මැද ජේසුස්වහන්සේ වෙතින් දිරි ලබා ප්‍රාණවත් වෙයි. |
| ක්‍රියාකාරකම 2.5 | : | "ජේසුස්වහන්සේ වෙතින් දිරි ලබමින් ප්‍රාණවත් වෙමු." |
| කාලය | : | මිනිත්තු 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශු බයිබලයේ ලූක් 24:13-35 |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.5.1 :

- ක්‍රිස්තුස්වහන්සේ මිනිසාට දුන් නව බලාපොරොත්තුව පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව සලසා දෙන්න.
- පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

> - බලාපොරොත්තුව මිනිස් ජීවිතයේ පදනම බව.
> - බොහෝ අවස්ථා වලදී මිනිසා කෙරෙන් බලාපොරොත්තුව ගිලිහෙන බව.
> - ජේසුස්වහන්සේ සිය ගෝලයින්ට හා මනුෂ්‍යත්වයට නව බලාපොරොත්තුවක් දුන් බව. ලූක් 24:13-35
> - අන්‍යයන්ට ද බලාපොරොත්තු දිය යුතු බව.

පියවර 2.5.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.5.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න

පියවර 2.5.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත සඳගත් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- මිනිසා නව බලාපොරොත්තුවක් සහිතව ජීවත් වන බව.
- මරණය කේන්ද්‍ර කරගත් අයට හා බලාපොරොත්තු කඩවූ අයට පුනර්ජීවනය නව බලාපොරොත්තු දුන් බව - ගීතාවලිය 23:3-4, මාර්ක් 16:1-8, 14
- පුනර්ජීවනයේ සිතුවිලි හා ක්‍රියාකාරීත්වය මිනිසාට නව බලාපොරොත්තු දෙන බව
- අප සමාජය නැවත වෙනස් කිරීමට කටයුතු කළ යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- බලාපොරොත්තුව ලබා දෙන ස්වාභාවික සිදුවීම් නම් කරයි. (උදා: දරු උපත්)
- නව බලාපොරොත්තු මනුෂ්‍යත්වයේ අඛණ්ඩ අවශ්‍යතාවයන් බව සාකච්ඡා කොට අදහස් එක් රැස් කරයි.
- ජේසුස්වහන්සේගේ උත්ථානයෙන් පෙර හා පසු ගෝලයින්ගේ ජීවිත තොරතුරු බයිබලීය උදාහරණ සහිතව එක් රැස් කරයි.
- බලාපොරොත්තු රහිත ශ්‍රී ලංකා සමාජය තුළ අපගේ පෞද්ගලික හා සමාජ ජීවිත නව බලාපොරොත්තු ලබා දෙන ක්‍රියාකාරීත්වයන්හී යෙදිය යුතු ආකාරය තීරණය කරයි.
- එම අත්දැකීම් අන්‍යයන් සමඟ බෙදා ගනියි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.5.1 :

- ඉශ්‍රායෙල් ඉතිහාසය තුළින් අවබෝධ වන්නේ බලාපොරොත්තු රහිත තත්ත්වයන්හී සිටින අයට දෙවිඳුන් බලාපොරොත්තු දෙන බව හා දෙන ආකාරයයි.
- ඍජුව හෝ වක්‍රව මරණයට මුහුණ පාන්ට සිදුවන අතර, ජේසුස්වහන්සේගේ උත්ථානය නව බලාපොරොත්තු හිමිකර දෙයි. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය නිසා ගෝලයින් බලාපොරොත්තු මැද අසරණව සිටින විට ජේසුස්වහන්සේගේ උත්ථානය මගින් ඔවුන්ට නව බලාපොරොත්තුවක් අත්විය.
- අද අප ජීවත්වන සමාජය ප්‍රාණවත් වීමෙන් පමණක් සියලු දෙනාගේම ජීවිත වලට නව අරුතක් ලැබෙන බව ඒත්තු ගත යුතුය.

ඇමුණුම 2.5.2 :

- විවාදයක් පවත්වන්න
  "දෙවියන්වහන්සේ මනුෂ්‍යත්වයට නව බලාපොරොත්තුවක් දෙන සේක/නොදෙන සේක".

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි. |
| නිපුණතා මට්ටම 2.6 | : | ජේසුස්වහන්සේගේ තුළින් ලබන පෝෂණය පිළිබඳව සාක්ෂි දරයි. |
| ක්‍රියාකාරකම 2.6 | : | "බෙදාගැනීම තුළින් ජේසුස්වහන්සේගේ නව ලොවට සාක්ෂි දරමු. " |
| කාලය | : | මිනිත්තු 80 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශු බයිබලයේ ජොහාන් 6:1-13 |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.6.1 :

- දරුවන්ට රොටි ගෙන ඒමට සලස්වා ඒවා බෙදාගෙන කෑමට ඉඩ හරින්න.
- ඒ ආශ්‍රයෙන් බෙදාගැනීම පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට යොමු කරවන්න.
- පහත සඳගත් කරුණු ද ඉදිරිපත් කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - බෙදා ගැනීම මිනිස් ජීවිතයට වැදගත් බව
> - බෙදා නොගැනීම නිසා බොහෝ දෙනෙකු දුක් විඳින බව
> - පන්දහසකට කන්ට දීමේ අවස්ථාව හා සම්බන්ධ දරුවා මෙන් අප සතු සියල්ල මිනිසා ජීවත් කරවීම සඳහා බෙදා ගැනීමට දෙවිඳුන් අප කැඳවන බව
> - පෞද්ගලිකව නොව පවුලක් හා සමාජයක් වශයෙන් බෙදා ගත යුතු බව.

පියවර 2.6.2 :

- සුදුසු පරිදි පංතිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.6.1හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.6.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- වර්තමානයේ බෙදා නොගැනීම නිසා වේදනාව ඇති බව.
- ජේසුස්වහන්සේ මනුෂ්‍යයන් සමඟ සියල්ල බෙදා ගත් බව.
- සමාජය තුළ එකිනෙකා සමඟ සුහද බෙදා ගැනීම තුළ ින් ඇතුළාන්ත ප්‍රීතියක් අත්දැකීමට ජේසුස්වහන්සේ අපව යොමු කරන බව

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :

- ආහාර බෙදා ගැනීම පිළිබඳව ගීතයක්/ කවියක්/ රචනයක්/ චිත්‍රයක් නිර්මාණය කරයි.
- තමන් සතු දෑ අන් අය සමඟ බෙදා ගත යුතු බව තීරණය කොට අන් අයට ඒ බව පවසයි.
- රෝහලකට/ බන්ධනාගාරයට/ අනාථ කඳවුරකට ගොස් තමන් සතු දේ ඔවුන් සමඟ බෙදා ගැනීමට කටයුතු කරයි.
- ජේසුස්වහන්සේ ඇති කළ නව ලෝකය හා පාසල් පරිසරය පිළිබඳ බෙදා ගැනීම පිළිබිඹු කරන පෝස්ටර් සකසයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.6.1. :

- වර්තමානයේ බෙදා ගැනීම නැති නිසාත් සුළු දෙනෙකුගේ ආත්මාර්ථය නිසාත්, මිනිසා දුක් විඳිමින් ඛේදාන්තයකට මුහුණ දෙයි. බොහෝ දෙනෙක් මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වත් අපොහොසත් වෙති.
- මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අනුව උත්සාහ දරන්නේ සුහද බෙදාගැනීම් සහිත සමාජයක් ගොඩ නැගීමටය. තමන් සතු දෑ බෙදා ගැනීමට ජේසුස්වහන්සේ ද ආරාධනා කරන සේක. ජේසුස්වහන්සේ මෙන් සමාජය වෙනස් කිරීමට මුල් සභාව ද තමන් සතු සියල්ල අවශ්‍යතාවය අනුව බෙදා ගන්නා ලදී. (ක්‍රියා 2:42-47)
- පෞද්ගලිකව ද සමාජයක් වශයෙන් ද අප සතු සියල්ල බෙදා ගත යුතුය. මනුෂ්‍යත්වය යහ පැවැත්වමකින් යුතු වන්නේ එවිටය. එවිට ජේසුස්වහන්සේ ඇති කිරීමට උත්සාහ දැරූ නව ලෝකයට මේ ලෝකය පරිවර්තනය වනු ඇත.

ඇමුණුම 2.6.2 :

- විවාදයක් පවත්වන්න.
  "බෙදා ගැනීම මානව සංහතියේ පැවැත්මට හිතකරයි/අහිතකරයි."

නිපුණතාව 2.0 : ජේසුස්වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි.

නිපුණතා මට්ටම 2.7 : ජේසුස්වහන්සේ මෙන් නපුරට අභියෝග කරමින් ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 2.7 : "නපුරට අභියෝග කරමින් ජේසුස්වහන්සේගේ නව ලොව සඳහා සාක්ෂිකරුවෝ වෙමු."

කාලය : මිනිත්තු 80 යි

ගුණාත්මක යෙදවුම් :
- ශු බයිබලයේ , ලූක් 8:22-25

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.7.1 :
- ජේසුස්වහන්සේගේ ගතිගුණ නපුරට අභියෝග කළ ආකාරය බයිබල් පද උදාහරණයට ගනිමින් පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ඒ ආශ්‍රයෙන් පහත සඳහන් කරුණු ද ඉදිරිපත් කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ජේසුස්වහන්සේගේ චරිත ලක්ෂණ අතර එකක් වන්නේ නපුරට අභියෝග කිරීම බව
> 1. ලූක් 8:22-25
>    මාර්ක් 6:45-52 නපුර
>    මතෙව් 8:23-27
> 2. ජොහන් 18:23 ප්‍රචණ්ඩත්වය
> 3. ලූක් 5:42 ආගමික ජීවිතය
> - මුහුද මගින් සංකේත වන්නේ නපුර බව.
> - නපුරට අභියෝග කිරීමට ජේසුස්වහන්සේ අප කැඳවන බව.

පියවර 2.7.2 :
- සුදුසු පරිදි කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.7.1 හි ඇතුළත් කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.7.3 :
- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- නපුරේ බලවේග මනුෂ්‍යත්වයට බරපතල ගැටුම් හා ප්‍රශ්නවලට ද ඉන්පසු අමානුෂික තත්ත්වයන්ට ද මු හුණ පෑමට සලස්වන බව.
- මිනිසාගේ වගකීම වන්නේ ජේසුස්වහන්සේ මෙන් නපුරට අභියෝග කිරීම බව.
- යහපත මගින් නපුරට අභියෝග කළ යුතු බව.
  උදා: 1. සතුරන්ට ප්‍රේම කිරීම (මතෙව් 5:44
  2. උදාර මනුෂ්‍යත්වය තුළින් ප්‍රශ්න වලට මු හුණ පෑම (මතෙව් 5:22)
  3. වස්තුව දේව රාජ්‍යත්වයේ හොඳ ලක්ෂණයක් විය යුතු බව. (ලූක් 18:24
- නපුර රජ කිරීම හෙළා දැකිය යුතු බව. (ලූක් 13:31, මාර්ක් 10:42-43)
- නපුරට අභියෝග කොට එය සුණු විසුණු කර සමාජය නිදහස් කිරීමෙන් ජේසුස්වහන්සේ නව ලොවක් සඳහා ක්‍රියා කළ බව.

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :

- ජේසුස්වහන්සේගේ ගතිගුණ වලින් එකක් වන්නේ නපුරට අභියෝග කිරීම බව බයිබලයෙන් උදාහරණ දෙමින් දක්වයි.
- නපුර සමඟ ජීවත් වෙමින් අන්‍යයන් හා බෙදා ගත නොහැකි බව ස්ථිර කොට අන්‍යයන්ට පවසයි.
- නපුර පිටු දැකීමට හා යහපත පවත්වා ගෙන යාමට අප සමාජයට පැහැදිලි දැනුමක් හා සක්‍රීය භාවයක් දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරයි.
- වර්තමාන ශ්‍රී ලාංකේය සංදර්භය තුළ සමාජය තුළ ක්‍රියාත්මක වන නපුර හා ඊට විරුද්ධව අද අපි ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු රැස් කොට ලැයිස්තු ගත කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 2.7.1 :

- වර්තමාන මිනිස් ජීවිතය විනාශ වන්නේ නපුර නිසාය. ක්‍රිස්තියානි ලෝකය නපුර හඳුන්වන්නේ සාතන් හා යක්ෂයා ලෙසිනි. ජීවිතයේ නපුරට අභියෝග කිරීමේ අරගලයේ අපි යෙදී සිටිමු. ජේසුස්වහන්සේ මෙම අරගලයේ යෙදුණු සේක. බයිබලයේ මුහුද සංකේත වන්නේ නපුර ලෙසිනි. (ශු ලූක් 8:22-26, මාර්ක් 6:45-52, මතෙව් 8:22-27, එළිදරව් 21:1-5) ජේසුස්වහන්සේ සම්පූර්ණයෙන්ම නපුර පරාජය කිරීමට කටයුතු කළ සේක. එහෙත් නපුර කරන තැනැත්තාට ජේසුස්වහන්සේ ආදරය කළා විනා වෛර නොකළ සේක. උන්වහන්සේ නපුර කරන්නන්ට උදාර මනුෂ්‍යත්වයෙන් යුතුව සැලකූ සේක. (මතෙව් 5:22) නපුර කරන්නන්ට යහපත කළ යුතු බව ජේසුස්වහන්සේ ඔවුන්ටම පැහැදිලි කළ සේක. (මතෙව් 7:12) ජේසුස්වහන්සේ නපුර රජකම් කිරීම හෙළා දුටුසේක. (ලූක් 13:31, මාර්ක් 10:41-43)

- ජේසුස්වහන්සේගේ චින්තනයේ වැදගත් කම වන්නේ නපුරේ අභියෝගයන් ගෙන් කල කිරීම වෙනුවට නපුරට අභියෝග කිරීමයි. මේ තුළින් සතුරු බව ඉක්මවමින් නව ලොවක් උදාකළ හැකිය.

ඇමුණුම 2.7.2

වගුව සම්පූර්ණ කරන්න.

| නපුරේ බලවේග | මිනිසාට ඇති අපහසුතාවයන් | නපුරේ බලවේග වැළැක්වීමට මිනිසා ගත යුතු ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1. ආත්මාර්ථකාමී ක්‍රියාවන්<br>උදා : පාසලේ ලිඳ අසල මුහුණ සේදීමට වැඩි වේලාවක් ගත කිරීම | 1. පොදු යහපත සඳහා ඉඩක් නොවීම<br>උදා: බොහෝ දෙනෙකු මුහුණ සේදීමට පෝලිමේ සිටීම | 1. පොදු යහපත සඳහා සමානත්වයෙන් කටයුතු කිරීම<br>උදා: වෙනත් බාල්දියක් මගින් මුහුණ සෝදා ගැනීම |
| 2. අල්ලස | | |
| 3. මත්ද්‍රව්‍ය විකිණීම | | |
| 4. දූරාචාරය | | |
| 5. ප්‍රචණ්ඩත්වය | | |

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 3.1 | : | දිළින්දන් දේව රාජ්‍යයේ පුරවැසියන් බව පිළිගෙන ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 3.1 | : | "දේව රාජ්‍යය තුළ ජීවත් වන අපි දිළින්දෝ වෙමු." |
| කාලය | : | මිනිත්තු 80 |
| ගුණාත්මක යෙදවුම් | : | • බයිබලය<br>• ඇමුණුම 3.1.1 හා 3.1.2. ඩිමයි කොළ හා මාකර් පෑන්.<br>• දිළින්දන්ගේ වීඩියෝ පටයක් හෝ පින්තූරයක් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.1 :

- දිළින්දන් ගැන සඳහන් උපකරණය පෙන්වා ශිෂ්‍යයන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න.
- මේ සිසුන්ගේ සාකච්ඡාව පදනම් කරගෙන පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - දේව රාජ්‍ය යනු අප අතර පවතින දෙයක් බව.
> - අත්‍යාවශ්‍ය දෑ සපුරා ගත නොහැකි අය දිළින්දන් ලෙස සලකන බව.
> - ධනවතුන් යනු අන් අය සමඟ ලෝකයේ සම්පත් බෙදා ගැනීමට අකමැතිව ආත්මාර්ථකාමී ලෙස එය භාවිතයට ගනිමින් සිටින අය බව.
> - දිළිඳු අය බඩගිනිව සාගිනිව අඬන විට ධනවත් අය සිනාසෙමින් විනෝද වෙමින් සිටීම වරදක් බව. (ලූක් 6:22-36)
> - දිළිඳු අයට යහපත් ජීවිතයක් සාදා දීම සඳහා මූලිකත්වය ගෙන අප කටයුතු කළ යුතු බව.

පියවර 3.1.2 :

- සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 3.1.1 හා 3.1.2, ඩිමයි කොළ, මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 3.1.3 :

- කුඩා කණ්ඩායම් සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- ඉදිරිපත් වන ආකාරයට මුලින් ඉදිරිපත් වීමට සලස්වන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- දිළිඳුන් දු:ඛිතව මනුෂ්‍යත්වයේ පහළම තලයේ ජීවත්වන බව.
- දිළිඳුන්ට යහපත් ජීවිතයක් ගොඩ නංවා දීමට සියලු මිනිසුන් අතහිත දිය යුතු බව.
- ධනවතුන්ට දේව රාජ්‍යයට ඇතුල් වීම දුෂ්කර බව. (මතෙව් 19:16-30, ලූක් 12:13-21, 16:19-31, 19:1-10, 6-21-26)
- ධනවත් අය පසුතැවිලිවී ඔවුන් සතු දේ දිළිඳුන් සමඟ බෙදා ගනිමින් ජීවත් විය යුතු බව.
- තමන් ගැනම හඳුනාගෙන, දිළිඳුන් සමඟ එය බෙදාගෙන ඔවුන් ගැළවීම සඳහා කටයුතු කිරීමෙන් සදාතන ජීවනය අත්වන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- "දිළිඳුන්ට දේව රාජ්‍යය හිමිය" පැහැදිලි කරයි.
- "ධනවතුන් තමන් සතු දේ දිළිඳුන් සමඟ බෙදා ගත යුතුය යන්න" පිළිගෙන එය අන්‍යයන් සමඟ බෙදා ගනියි.
- දිළිඳුන්ට යහපත් ජීවිතයක් ලැබෙන සේ තම ධනය බෙදාගැනීමට ධනවතුන්ගේ සිත පසුතැවිලිව සූදානම් කරවන සේ ධනවතුන් පිළිබඳව යාච්ඤාවක් කරයි.
- දිළිඳුන්ට හොඳ ජීවිතයක් ලැබෙන්නට සමාජයක් ලෙස කළ හැකිදේ අදාළ අය සමඟ සාකච්ඡා කර එය කිරීමට ඉදිරිපත් වෙයි.

ඇමුණුම3.1.1

- පහත ජේද කියවන්න
- පහත වගුව පුරවන්න

- දේව ප්‍රතිරූපයෙන් මවන ලද මිනිසා සමානත්වයෙන් ජීවත් විය යුතුය. නමුත් බහුතරයක් දිළිඳුන් ලෙස සිටිති. සුළුතරයක් සම්පත් බහුතරයක් තම අත දරා සිටිති. මේ නිසා දිළිඳුන් අන්ත දු:ඛිත තත්ත්වයකට පත්කරනු ලබයි.

- දේව රාජ්‍යයේ පුරවැසියන් දිළින්දන්ය. ලූක් 6:20 ධනවතුන්ට දේව රාජ්‍යයට ඇතුළත් වීමදුෂ්කරය. මතෙව් 19:16-30/ ලූක් 6-22-26/ 12:13-21 / 16:19-31/ 19:1-10. මේ නිසා ධනවත් අය තමන් සතු දේ දිළිඳුන් සමඟ බෙදා ගත යුතුය. ඔවුන් තම හදවතින්ම දිළිඳුන් වෙනුවෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. දිළිඳුන් සමඟ ඔවුන් ඒකත්වයකට පත්විය යුතුය. ධනවතුන් දිළිඳුන්ට ගරු කළ යුතුය. දිළිඳු අයද යහපත් පුද්ගලයන් ලෙස ජීවත් විය යුතුය. ඒ මගින් මනුෂ්‍යයා උසස් මට්ටමකට පත්වනු ඇත.

ඇමුණුම 3.1.2

| | අද සමාජයේ තත්ත්වය | දේව රාජ්‍යයේ ස්වභාවය | අපට පවසන්නට ඇති පණිවිඩය | බලාපොරොත්තු වන සමාජ පරිවර්තනය | දේව රාජ්‍යයේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| 1. දිළිඳු දරුවෙක් | දිළිඳුකම | දේව රාජ්‍ය හිමිකරුවෙක් | යහපත් ජීවිතයක් ගතකරයි. | සමාජය තුළ කුඩා දරුවා මගින් කුඩා ලෙස දේව රාජ්‍ය ආරම්භ වීම. | දේව රාජ්‍ය පුරවැසියෙක් |
| 2. ඉපදුන දරුවෙක් | | | | | |
| 3. වැඩකරන ධනවතෙක් | | | | | |
| 4. වත්තේ වැඩකරන දිළින්දෙක් | | | | | |
| 5. අනාථ තරුණියක් | | | | | |

නිපුණතාව 3.0 : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.2 : ප්‍රේමය කේන්ද්‍ර කරගත් ජීවිත ගත කරයි.

ක්‍රියාකාරකම 3.2 : "ප්‍රේමයේ පදනම මත දේව රාජ්‍යයෙහි ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 120

ගුණාත්මක යෙදවුම් :
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්
- ඇමුණුම 3.2.1 හා 3.2.2. බයිබලය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය


පියවර 3.2.1 :
- යහපත් සමාරිතයාගේ කථාව නාට්‍යානුසාරයෙන් දක්වයි. මෙයට ළමුන් 6ක් පමණක් වුවද සෑහේ.
- ඒ තුළින් ප්‍රේමයේ ගුණාංග සාකච්ඡා කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- දේව රාජ්‍යයේ ප්‍රධාන ගුණාංගයක් වන්නේ අන් අයට දක්වන ප්‍රේමය බව.
- සතුරන්ටද ප්‍රේම කළ යුතු බව. ලූක් 6:27-36
- ප්‍රේමය යනු අවශ්‍යතාවය ඇති කෙනෙකුට උපකාර කිරීම බව. ලූක් 10:25-37
- අප ප්‍රේමයෙන් යුතුව ජීවත් විය යුතු බව.

පියවර 3.2.2 :
- සුදුසු පරිදි කණ්ඩායම් බෙදන්න.
- ඇමුණුම, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් බෙදා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 3.2.3 :
- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- ප්‍රථම කණ්ඩායම් වලට ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමට දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

මනුෂ්‍යයා දුක් විඳින්නේ ප්‍රේමය නොමැති කම නිසා බව.
ප්‍රේමය අනුව ජීවත්වීම දේව රාජ්‍යයේ පුරවැසියකුගේ ගුණාංගයක් බව.




ගැඹුරු ප්‍රේමයක් ඇතිවිට උදාර මනුෂ්‍යත්වයක් ගොඩනැගී අපගේ ජීවිත අනෙක් ජීවිත හා සමාජය ගොඩනැගෙන බව. ලූක් 10:25-37

-

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තමන්ටවත් ප්‍රේම නොකොට සිය දිවි නසා ගැනීමට ගිය කෙනෙකු පිළිබඳව පැහැදිලි කරයි.
- "ප්‍රේමය අද අප සමාජය තුළ දේව රාජ්‍ය ගොඩ නගනු ලබයි." මෙය සාක්ෂ්‍යාත් කරගෙන ප්‍රකාශ කරයි.
- "ප්‍රේමනීය පුද්ගලයකුගේ ජීවිතයේ ස්වභාවික හා ක්ෂණික ක්‍රියාකලාපය තුළද දැකිය හැක්කේ ප්‍රේමනීය ස්වභාවයකි." පැහැදිලි කරයි.
- කේවලව හෝ සමූහයක් ලෙස ප්‍රේමය කේන්ද්‍ර කොටගත් සමාජයක් ගොඩ නැගීමට කළ හැකි දේ අදාළ පුද්ගලයන්ගෙන් අසා එකතු කරයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

ඇමුණුම 3.2.1

- දේව රාජ්‍යයේ ප්‍රධානතම ගුණාංගය වන්නේ ප්‍රේමයයි. දුක් විඳිමින් හා අධෛර්යමත් වෙමින් දුක්ඛිත තත්ත්වයේ සිටින පුද්ගලයෙක්, පවුලක් හෝ සමාජය එම තත්ත්වයට පත්වීමට හේතුව ලෙස දැකිය හැක්කේ සම්පූර්ණ ප්‍රේමයෙන් කටයුතු නොකිරීමයි.

- අප අපටම ප්‍රේම කර ගන්නා අතරම, ආත්මාර්ථකාමී ප්‍රේමයෙන් තොරව අන්‍යයන් හා දෙවිඳුන් සමඟ එම ප්‍රේමය බෙදා ගැනීමෙන් මනුෂ්‍යත්වය උදාර කර ගත හැකිය. අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම මනුෂ්‍ය ගුණයකි. ලූක් 10:25-36 සතුරාටද ප්‍රේම කරමින් සබඳතා ගොඩ නගා ගැනීම මනුෂ්‍යත්වයට අවශ්‍යය. ලූක් 6:27-36. මේ පදනමින් ප්‍රේමය ඇති කරයි. මේ අනුව යහපත මුල්කරගත් නව ලෝකයක් අද උදාකළ හැකිය.

- මේ අනුව ආත්මාර්ථකාමිත්වයෙන් තොරව ප්‍රේමය උපකරණයක් කර ගැනීමට අපි මුල් වී කටයුතු කරමු.

ඇමුණුම 3.2.2

කථික තරඟයක් පවත්වන්න.

මාතෘකා

1. "ප්‍රේමය යනු අවශ්‍යතා ඇති අයට උපකාර කිරීමය".

2. "ප්‍රේමය මනුෂ්‍යත්වය හා දෙවියන්වහන්සේ අතර සබඳතාවය ප්‍රකාශ කරයි".

3. "ප්‍රේමය ආත්මාර්ථකාමීත්වය ප්‍රමුඛ කර නොගත්තක් වුවද එය සියදිවි නසා ගැනීම අනුමත නොකරයි".

4. "ප්‍රේම නොකරන්නන් හා ප්‍රතික්ෂේප කරන්නා දිළිඳුන්ගේ දිළිඳෙකි".

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වෙයි |
| නිපුණතා මට්ටම 3.3 | : | දේව රාජ්‍යත්වය තුළ සමාව පදනම් කරගෙන ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 3.3 | : | "සමාව කේන්ද්‍ර කොටගත් ජීවිත ගතකරමු." |
| කාලය | : | මිනිත්තු 120 යි. |
| ගුණාත්මක යෙදවුම් | : | • 3.3.1, 3.3.2 විස්තර ලබාගන්න. බයිබලය, මාකර් පෑන්, ඩිමයි කඩදාසි |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.3.1 :

- 3.3.1 ඇමුණුම කියවා පැහැදිලි කරගැනීමට කාලය දෙන්න.
- ස්වාමින්වහන්සේගේ යාච්ඤාව සියලු දෙනාම එකතුවී කියන්න. එහි කමාව පිළිබඳ අදහස දැක්වීමට සලස්වන්න. මතෙව් 6:12, ලූක් 11:4

  පහත සඳහන් කරුණු විමසමින් සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • මනුෂ්‍ය ජීවිතයේ කමාව දිය යුතු බව<br>• දේව රාජ්‍යයේ වටිනාකම්වලින් මෙය වැදගත් එකක් බව<br>• නොදැන කළ වැරදි වලට සමාව දී ඔවුන් වෙනස් කළ යුතු බව. ලූක් 23:32-34<br>• කමාවේ සීමාව පසුතැවිල්ල බව. ලූක් 17:3-4<br>• අප දෙවියන්වහන්සේගෙන් කමාව ලැබීමට අප අනෙක් අයට සමාව දිය යුතු බව.<br>• අප කමාව දීමට ඉදිරිපත් විය යුතු බව. |

පියවර 3.3.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ඇමුණුම් ශිෂ්‍යයන් වෙත ලබා දෙන්න.
- කාර්යය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 3.3.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරන්න.
- විස්තාරණය සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් වූ කණ්ඩායමට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- කමාව දීමෙන් තොර ජීවිතයක් නැති බව.
- වර්තමාන සමාජය කමාව දීමට අකමැති කම සමාජයේ විනාශයට හේතු වී ඇති බව.
- කමාව ඉතා වැදගත් බව
  1. නොදැන වැරදි කරන අයට සමාවදීමෙන් එය ය හපත් මාර්ගයකට ගෙන යැමට අවස්ථාවක් වන බව.
  2. සමාව ලැබීමට අප කැමති වන්නාක් මෙන් කමාව දීමටත් අප සූදානම් විය යුතු බව.
- කමාව දීම සීමාවකින් තොරව සිදුවිය යුතු බව.
- කමාව දීමෙන් යහපත් සමාජයක් කරා යා හැකි බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- වැරදි කරන අයට, යහපත් ජීවිතයක් කරා යාමට අවස්ථාවක් ලෙස සමාව දිය යුතු බව පැහැදිලි කරයි.
- පසුතැවිල්ලෙන් සමාව අයදින අයට සීමාවකින් තොරව එය දිය යුතු බව පැහැදිලි කරයි.
- කමාව ලබාගැනීමත් කමාව දීමත් යන අදහස් අන් අය අතර බෙදාගනියි.
- ස්වාමින්වහන්සේගේ යාච්ඤාවේ කමාව පිළිබඳ අදාළ කොටස අවධාරනයෙන් ප්‍රකාශ කරයි.

ඇමුණුම 3.3 :

- දේව රාජ්‍යයේ වටිනාකම්වලින් වැදගත් එකක් වන්නේ සමාව දීමයි. සමාව පෞද්ගලිකව හා සාමූහිකව දීමට සූදානම් විය යුතුය. වර්තමාන සමාජයේ ගැටුම්, කලකිරීම, දුක්විදීමට හේතු වී ඇත්තේ සමාජයේ සමාව දීමේ ගුණය නොමැති කමයි.
- ජේසුස්වහන්සේ කමාවීමේ ගුණය තම ජීවිතයෙන් පෙන්වූ සේක. නොදැන වැරදි කරන අයටද උන්වහන්සේ කමාව දුන්සේක. ලූක් 23:32-34
- කමාව ලබාගැනීම පමණක් නොව කමාව දීමද වැදගත් බව උන්වහන්සේ පැවසූසේක. මතෙව් 18:21-35
- ස්වාමින්වහන්සේගේ යාච්ඤාව තුළින් අපට වැරදි කරන අයට අප කමාව දෙන්නාක් මෙන් අපගේ වරදවලටද අපට කමාව දෙන බව උන්වහන්සේ ඉගැන්වූ සේක. අප වැරදි කරන අයට සීමාවකින් තොරව සමාව දීම තුළින් යහපත් සමාජයක් ගොඩනැගීමට ක්‍රියා කළ යුතුය.

ඇමුණුම 3.3.2 :

විවාදයක් සඳහා පහත සඳහන් මාතෘකා යටතේ සූදානම් කරන්න.

1. "අප නිරන්තරයෙන් සමාව දීමෙන් යහපත් සමාජයක් ගොඩනැගිය හැකිය." "සමාව නොදීමෙන් අයහපත් සමාජයක් ගොඩනැගේ."

නිපුණතාව 3.0 : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.4 : සේවක නායකත්වයේ ජීවිත ගතකරයි.

ක්‍රියාකාරකම 3.4 : "සේවක නායකත්වය කේන්ද්‍ර කොටගත් ජීවිත ගතකරමු."

කාලය : මිනිත්තු 120 යි

ගුණාත්මක යෙදවුම් :
- ශුද්ධවූ බයිබලය - ජොහන් 13:1-20
- ඩිමයි කොළ, මාකර් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.4.1 :
- සෙසු නායකත්ව අතරින්, සේවක නායකත්වය බොහෝ වෙනස් බව සාකච්ඡා කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - සේවක නායකත්ව ආකෘතිය දේව රාජ්‍යයේ සුදුස්සන් බවට අපව පත්කරන බව.
> - සේවක නායකත්වය කේන්ද්‍ර වන්නේ සේවය මත බව.
> - සේවය පෙරදැරිකරගත් නායකත්වය අප අනුගමනය කළ යුතු බව.

පියවර 3.4.2 :
- විවාද තරඟයක් සඳහා සිසුන් සූදානම් කරන්න.
- ඇමුණුමෙහි ඇති මාතෘකාව සැලකිල්ලට ගන්න. අවශ්‍ය බයිබල් පාඨ, ඩිමයි කඩදාසි, පෑන් කණ්ඩායම් වලට ලබාදෙන්න.
- කරුණු රැස්කිරීමට කාලයක් දෙන්න.
- කණ්ඩායම් 2ක් විවාදයට ඉදිරිපත් කර සෙසු අය නිරීක්ෂණය කිරීමට යොදවන්න.

පියවර 3.4.3 :
- විවාද කණ්ඩායම් වල අදහස් පන්තියට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණයට, කණ්ඩායම් දෙකටම අවස්ථාව දෙන්න.
- පන්තියේ සෙසු අයගෙන් යෝජනා හා අදහස් ලබාගන්න.
- පහත කරුණු අනුව සමාලෝචනයේ යෙදෙන්න.

- සේවය කරන විට අධිකාරීත්වය වැදගත් නොවන බව හා එය සේවය සඳහා විය යුතු බව.
- ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් සේවය කළා මිස සේවය බලාපොරොත්තු නොවූ බව.
- වහල්කමේ ආකෘතියට හා අධිකාරී බලය කේන්ද්‍ර කොටගත් නායකත්වයක් සහිත වර්තමාන නායකත්වයට, සේවක නායකත්වය අභියෝග කරන බව.
- ජේසුස්වහන්සේ මෙන් සේවයේ ආත්මයෙන් ජීවත්වන විට අප යහපත් සමාජයක් බිහිකරන බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සේවක නායකත්වය පැහැදිලි කරයි.
- ජේසුස්වහන්සේගේ නායකත්වය සේවක නායකත්ව ආකෘතිය රැගත් බව සාකච්ඡා කොට ඉදිරිපත් කරයි.
- වර්තමාන සේවක නායකත්වය මුහුණ දෙන අභියෝග ලැයිස්තු ගත කරයි.
- අධිකාරීත්වය කේන්ද්‍ර කොටගත් නායකත්වයට සේවක නායකත්වය ඉදිරිපත් කරන අභියෝග කවරේදැයි ලැයිස්තු ගත කරයි.

ඇමුණුම 3.4.1

- දේව රාජ්‍යයේ වටිනාකම් අනුව නායකත්ව ආකෘතින් හඳුන්වාදීමේදී වැදගත් වන්නේ සේවක නායක ආකෘතිය බව හඳුනාගත යුතුය.
- ජුදෙව් නිවෙස්වල සිටින වහලුන් ආගන්තුකයන්ගේ පාද සේදුවාක් මෙන් ජේසුස්වහන්සේ සිය ගෝලයන්ගේ පාද සේදූ සේක.
- සේවය සඳහා සේවක නායකත්වය වැදගත්කමක් ලබාදෙයි. ඒනිසා වර්තමානයේ අධිකාරීත්වය කේන්ද්‍ර කොටගත් නායකත්වයට මහත් අභියෝගයක් එල්ල කරයි.
- එබැවින් අප සේවක නායකත්ව ආකෘතිය අනුගමනය කරන විට ඒකාන්තයෙන්ම යහපත් සමාජයක් බිහිවනු ඇත.

ඇමුණුම 3.4.2

- අප සමාජයට වඩා යහපත් වන්නේ අධිකාරී නායකත්වයද සේවක නායකත්වයද යන මාතෘකාව යටතේ විවාදයක් පවත්වන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වෙයි. |
| නිපුණතා මට්ටම 3.5 | : | ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් තොරව ප්‍රති උපකාර ලබානොගැනීමේ වටිනාකමින් යුතුව ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 3.5 | : | "ප්‍රති උපකාර ලබාගැනීමෙන් තොරව ජීවිත ගත කරමු." |
| කාලය | : | මිනිත්තු 120 යි. |
| ගුණාත්මක යෙදවුම් | : | • ශුද්ධවූ බයිබලය<br>• ඩිමයි කොළ, මාකර් පෑන් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.5.1 :

- ප්‍රති උපකාර ලබා නොගෙන ආහාර වේලක් දීම පිළිබඳව නාට්‍යයක් පන්තියේ රඟ දැක්වීමට අවස්ථාවක් දෙන්න. ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් දැක්වීමට අවස්ථාව සලසා දෙන්න. (ලූක් 14:7-23)
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ප්‍රති උපකාර බලාපොරොත්තු නොවී යමක් කිරීම ඉතා වැදගත් බව.
> - භෝජන සංග්‍රහයකට ගියවිට ඉදිරි පෙළ අසුන් බලාපොරොත්තු නොවිය යුතු බව. (ලූක් 14:7-23)
> - ප්‍රති උපකාර කිරීමට නොහැකි අයවද භෝජන සංග්‍රහයට කැඳවිය යුතු බව. (ලූක් 14:12-14)
>   උදා: දිළිඳුන්, අංගවිකලවූවන්, අන්ධයන් හා කොරුන්
> - කිසිදු ප්‍රති උපකාරයක් නොලබා අප ක්‍රියා කළ යුතු බව.

පියවර 3.5.2 :

- විවාදයක් සඳහා පන්තියේ සිසුන් සූදානම් කරන්න. ඇමුණුමෙහි ඇති කරුණු හා මාතෘකාව සැලකිල්ලට ගන්න. අවශ්‍ය බයිබල් පාඨ, කොළ හා පෑන් කණ්ඩායම් වලට ලබා දෙන්න.
- කරුණු රැස් කිරීමට කාලයක් දෙන්න.
- විවාදය සෙසු අයට නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3.5.3 :

- විවාද කණ්ඩායම් වල අදහස් පන්තියට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා කණ්ඩායම් වලට අවස්ථාව දෙන්න.
- සෙසු අයගේ යෝජනා හා අදහස් ලබාගන්න.
- පහත කරුණු අනුව සමාලෝචනයේ යෙදෙන්න.

- දේව රාජ්‍යයේ භෝජන සංග්‍රහය සඳහා ආරාධිතයන් විය යුත්තේ නුවර වීදි වල හා පටුමාවත් වල වෙසෙන අය බව. (මහා මංගල භෝජනය : ලූක් 14:15-24, මතෙව් 10:40-42)
- සුදුසු ආකාරයෙන් ඔබ යම් කෙනෙකු පිළිගන්නා විට ඒකාන්තයෙන්ම ඔබට ප්‍රතිඋපකාර ලැබෙන බව. (දිවැසිවරුන්, ධර්මිෂ්ඨයන්, ගෝලයන්. මතෙව් 10:40-42)
- ප්‍රතිඋපකාර වලින් තොරව ක්‍රියාකරන කල්හී ය හපත් ප්‍රතිඵල ලැබෙන බව.
- ප්‍රතිඋපකාර වලින් තොරව දේව රාජ්‍යයේ බීජ වැපිරීම කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් තොර ජීවිත කේන්ද්‍ර කොටගත් අය පැහැදිලි කරයි.
- ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් තොරව අප ක්‍රියා කරන විට අපගේ ක්‍රියාකාරකම් සඳහා අප කැඳවන්නේ කෙබඳු පුද්ගලයන් දැයි සාකච්ඡා කොට බෙදා ගනී.
- කිසිදු බලාපොරෝත්තුවකින් තොරව එම ක්‍රියාකාරකම් අධිෂ්ඨාන පූර්වකව කරන්නේ මන්දැයි අන්‍යයන්ට හේතු පැහැදිලි කරයි.
- ප්‍රති උපකාර වලින් තොරව ජීවත්වූ අයගේ ජීවන මාර්ග විමසා එකතු කරයි. (එක් රැස් කරයි) උදා: මියුරියල් හව්සන්, කරුණා නිලියම් (කිලිනොච්චිය) ඉවිලින් කානි මහත්මිය (තලාව)

ඇමුණුම 3.5.1

- ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් තොරව ජීවත්වන පුද්ගලයන් වර්තමාන සමාජයේ දුර්වලය.
- ප්‍රතිඋපකාර බලාපොරොත්තුවෙන් තොරව ජීවත්වන පුද්ගලයෝ භාග්‍යවන්තයෝය.
- ප්‍රති උපකාර ලැබීමේ බලාපොරොත්තුවේ භෝජන සංග්‍රහ පවත්වන නිසා භෝජන සංග්‍රහ පවා වාණිජකරණයට ලක්වී ඇත.
- ජේසුස්වහන්සේ දිළිඳුන් හා අබ්බගාතයන් භෝජන සංග්‍රහයට කැඳවන ලෙස උපදෙස් දුන්සේක.
- ආරාධනා ප්‍රතික්ෂේප කර දමා ඇතිමුත් කුමන ආරාධනාවක් හෝ නොලැබේයයි සිතන අයට ආරාධනා කළ යුතුය. ලූක් 14:17-23
- ප්‍රති උපකාර බලාපොරොත්තුවකින් තොරව මෙහෙවරෙහි යෙදෙන විට අපට දෙවිඳුන්ගෙන් ඒ සඳහා ප්‍රති උත්තර ලැබෙන බව සිහිකට යුතුය. මතෙව් 10:40-42
- දේව රාජ්‍යය සඳහා අප ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් තොරව ජීවත් වන විට ඒකාන්තයෙන්ම යහපත් සමාජයක් උදාවනු ඇත.

ඇමුණුම 3.5.2

විවාදය

"ප්‍රති උපකාර බලාපොරොත්තුවකින් <u>තොරව</u> දේව රාජ්‍යය තුළ සේවය කිරීම සුදුසුය".

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 3.6 | : | යහපත් ඵලදැරීමේ වටිනාකම කේන්ද්‍රකොටගත් ජීවිත ගත කරයි. |
| ක්‍රියාකාරකම 3.6 | : | "යහපත් ඵල දැරීමේ වටිනාකම් කේන්ද්‍රකොටගත් ජීවිත ගත කරමු." |
| කාලය | : | මිනිත්තු 120 යි. |
| ගුණාත්මක යෙදවුම් | : | • ශුද්ධ බයිබලය<br>• ඩිමයි කොළ, පෑන් |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.6.1 :

- යහපත් ඵලදැරීමේ අවස්ථා පිළිබඳ සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- පහත කරුණු මතුකරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - මනුෂ්‍යයාට ජීවත්වීම සඳහා යහපත් ඵලදැරීම අවශ්‍ය බව.
> - මනුෂ්‍යයා විනාශවීමට හේතුව වන්නේ බොහෝ දෙනා යහපත් ඵල නොදැරීම බව.
> - යහපත් ඵල දැරීමේ ස්වභාවයෙන් යුක්ත වන විට පමණක් යහපත් ඵල දැරිය හැකි බව.
> - යහපත් ඵල දරණ පුද්ගලයන් බවට පත්වෙමින් දේව රාජ්‍යය සඳහා සේවය කළ යුතු බව.

පියවර 3.6.2 :

- පන්තියේ සියලු සිසුන් ලිඛිත පරීක්ෂණයක් සඳහා සූදානම් කරන්න.
- සිසුන්ට කොටස් 6කින් යුත් වගුවක් රූල් කර ගැනීමට සලස්වන්න.
- එහි ක්‍රියාකාරකම් 6කින් යුත් වගුව සම්පූර්ණ කිරීමට සලස්වන්න.

පියවර 3.6.3 :

- මුළු පන්තියම මේ සඳහා ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන් ලියූ කරුණු වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න. පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

යහපත් ඵල දැරීම මිනිස් වටිනාකමක් බව.

- යහපත් ඵලදැරීමේ අවශ්‍යතාවයෙන් පෙළෙන පුද්ගලයන් බවට පත්විය යුතු බව.
- ඵලදරණ ජීවිත සඳහා සාක්ෂි දැරිය යුතු බව. (ලූක් 3:8)
- යහපත් ඵල දැරීමට අවස්ථාවක් දිය යුතු බව.
- යහපත් ඵලදරණ තැනැත්තන්ට පමණක් දේව රාජ්‍ය යට ඇතුළු විය හැකි බව. (ලූක් 4:43-45)
- සම්පූර්ණ වශයෙන්ම යහපත් ඵල දරණ පුද්ගලයන් ලෙස ජීවත් විය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- යහපත් ක්‍රියාකාරීත්වය මගින් අන්‍යයන්ට යහපත් ඵලදරණ පුද්ගලයන් හඳුනා ගත හැකි බව පැහැදිලි කරයි.
- මනුෂ්‍යත්වය සංවර්ධනය වන්නේ යහපත් ඵල දැරීමෙන් පමණක් බව, තීරණය කර අන් අය සමඟ බෙදාගනියි.
- යහපත් ඵල දැරීමකින් තොරව ජීවත්වීම මගින් මනුෂ්‍යත්වයට කිසිදු යහපතක් උදා නොවන බව සාකච්ඡා කර අදහස් එක් රැස්කරයි
- යහපත් ඵලදැරීමෙන් ජීවිත අර්ථවත් වන බව, තීරණය කොට කණ්ඩායමක් වශයෙන් අනෙක් අයට ඒ බව පවසයි.

ඇමුණුම 3.6.1

- ඵල දැරීමෙන් තොරව ආත්මාර්ථකාමීත්වයෙන් හා දුෂ්ටකමින් ජීවත්වීම නිසා මනුෂ්‍යයා දුකට හා වේදනාවට පත්වේ.
- පෞද්ගලිකව හා සාමූහිකව යහපත් ලෙස ඵල දැරීම මිනිස් ජීවිතය සඳහා හේතුවක් වේ.
- සමාජය නපුර කෙරෙහි යොමුකරන විට එමගින් මනුෂ්‍යත්වය පීඩාවට පත්වේ.
- අද ප්‍රධාන අවශ්‍යතාවය වන්නේ යහපත් ඵල දරණ පුද්ගලයන්ය.
- යහපත් ඵලදරණ පුද්ගලයන් හා සමාජ මිනිස් ජීවිත ස්ථාවරත්වයට පත්කරගනියි.
- යහපත් ඵලදැරීමේ ස්වභාවයෙන් යුතුව, පුද්ගලයන් සමාජය වෙනස්කළ යුතුය. ඒ සඳහා අවස්ථාවක් ලබා දී ඇත. ලූක් 13:9
- පුද්ගලයන් හා සමාජයක් වශයෙන් ඵලදැරීම අවබෝධ කරගත හැක්කේ ඔවුන්ගේ ජීවන රටාව අනුවය.
- යහපත් ඵලදැරීම තුළින් පමණක් මිනිසාගේ පැවැත්ම අඛණ්ඩව සිදුවේ. ලූක් 3:8
- අප සියලුදෙනාම එය පෙරදැරි කොට ගෙන ජීවත් විය යුතුය.

ඇමුණුම 3.6.2

පහත වගුව සම්පූර්ණ කරන්න. මෙම ආකෘතිය පුරවන්න

| ක්‍රියාකාරකම | නපුරෙහි ප්‍රතිඵල | ගතහැකි පියවර | එහි ප්‍රතිඵල | එලදැරීම තුළින් සමාජය වෙනස් වේ |
|---|---|---|---|---|
| 1. අන්‍ය ගරුත්වයකින් තොරව ජීවත්වීම | සබඳතා බිඳවැටීම | ගරුත්වයෙන් ජීවත්වීම | යහපත් සබඳතා ගොඩ නැගෙයි | යහපත් එලදරණ සමාජ සම්බන්ධතා යුතු සමාජයක් |
| 2. | | | | |
| 3. | | | | |

නිපුණතාව 3.0 : දේවරාජ්‍යයේ වටිනාකම්වලට අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.7 : දරුවන්ට හිමි ස්ථානය ලබාදෙන ජීවිතයක් ගතකරයි.

ක්‍රියාකාරකම 3.7 : "දරුවන්ට හිමි ස්ථානය ලබාදෙන යහපත් ජීවිත ගතකරමු."

කාලය : මිනිත්තු 120 යි

ගුණාත්මක යෙදවුම් :

- ශුද්ධවූ බයිබලය, මතෙව් 18:1-15, 19:13-25

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.7.1 :

- දරුවන් ජීවත්වන ආකාරය පිළිබඳ ඔවුන්ගේ සිතිවිලි ඉදිරිපත් කිරීමට සලස්වන්න. පහත
- කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - දරුවන් වධ හිංසාවට භාජනය වන සමාජයක අප ජීවත්වන බව උදා: වැඩකිරීමට බලකිරීම, මිනිසුන්ට මෙන් ඔවුන්ට ගරු නොකිරීම, වේදනාව හා තැලීම.
> - දේව ප්‍රතිරූපයෙන් දේව ජනතාව ලෙස දරුවන් මැවූ බව.
> - දරුවන්ට දේව රාජ්‍යයේ වටිනාකම් මත හෝ මිනිස්
> - වටිනාකම් මත ජීවත් වීමට ඉඩදිය යුතු බව.
> - දරුවන්ට ගරු කරන සමාජයක් බිහිකරලීමට අප කටයුතු කළ යුතු බව.

පියවර 3.7.2 :

- සුදුසු පරිදි කණ්ඩායම් වලට වෙන්කරන්න. ඇමුණුම් හා කඩදාසි, මාකර් පැන් ලබා දෙන්න. කාර්යය පවරා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න. සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.7.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ - සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ප්‍රථමව ඉදිරිපත් වූ කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙන්න.

- මානව ගරුත්වයෙන් තොරව ජීවත්වීමට දරුවන්ට බල කර ඇති බව.
- දරුවන් දේව රාජ්‍යයේ පුරවැසියන් වන බව.
- දෙව්දූතූන් හා වැඩිහිටියන් තුළින් දරුවන් යැපෙන බව. (මතෙව් 18:1-5)
- දරුවන්ට වැදගත් ස්ථානයක් නොදුන් විට ජේසුස්ව හන්සේ අමනාප වූ බව. මාර්ක් 10:11-13
- ළමා අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ දරුවන් හා දෙමාපියන් දැනුවත් කළ යුතු බව.
  (ළමා අසාධාරණත්වය, ළමා රුචිකත්වය)
- දරුවන්ට යහපත් ජීවිත ගත කිරීමේ අවස්ථා උදාකරලීමට ක්‍රියා කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- දරුවන් දේව රාජ්‍යයේ පුරවැසියන් බව පැහැදිළි කරයි.
- දරුවන් දෙව්දූතූන් වෙතින් යැපෙන බව කීම, අදාළ වේද යන්න සාකච්ඡා කර ස්ථිර කරයි.
- දරුවන් පිළිබඳ බයිබල් පද එක් රැස් කරයි.
- වර්තමාන සමාජයේ දරුවන් හිංසාවට ලක්වන අවස්ථා හා ඔවුන් මුණ පාන බාධාකාරී සිදුවීම් නම් කරයි.
- දරුවන් හිංසාවට පත්කිරීමට විරුද්ධව ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කොට අන්‍යයන්ට දක්වයි.
- උදාර මනුෂ්‍යත්වය සඳහා දරුවන් අගය කළ යුතු බව තීරණය කොට දැනුම් දෙයි.
- ළමා අයිතීන් උල්ලංඝනය කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සඳහන් වන පුවත් පත් ලිපි එක් රැස්කරයි.

ඇමුණුම3.7.1 :

- අද සමාජයේ දරුවන්ගේ අයිතීන් වලට ගරු නොකිරීම නිසා ඔවුන් වධ හිංසා වලට භාජනය වේ. ළමා අනන්‍යතාවයට වැදගත් ස්ථානයක් නොදේ. දරුවන්ව භාවිතා කරන්නේ වැඩිහිටියන්ගේ අණ පිළිපදිමින්, ඔවුන්ගේ අදහස් පූර්ණ කරන්නන් වශයෙනි.
- දරුවන් දේව රාජ්‍යයේ පුරවැසියන්ය වැඩිහිටි යුතුකම වන්නේ දරුවන්ට උදාර මනුෂ්‍යත්වය හා අයිතිවාසිකම් සමගින් ජීවත්වීමට අවකාශ සැලසීමයි. වැඩිහිටියෝ දරුවන්ගෙන්ද යහපත් දේ ඉගෙන ගනිති. උදා: වැඩිහිටියන් දරුවන් මෙන් වෙනස් වී දෙවිඳුන් කෙරේ බලා සිටිය යුතුය. දෙමව්පියන්, ගුරුවරුන් දරුවන්ට ආදරය කරමින් ඔවුන්ට ගරු කළ යුතුය. අද සමාජය නිවැරදි මගකට යොමුකර ජීවත් වීම සඳහා යහපත් දරුවන් අවශ්‍යය.

- දරුවන් යහපත් ආකල්ප සහිතව ජීවත් විය යුතුය. ආත්මාර්ථකාමී බව, එකිනෙකා අතර ගැටීම්, වැනි අයහපත් ආකල්ප බැහැර කළ යුතුය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අවුල් සහගත තත්ත්වයක් ඇත. එය යහපත් කිරීමට සමාජය පරිවර්තනය කිරීම සඳහා පාසල ඒකකයක් වශයෙන් ගෙන දරුවන් මේ සඳහා ක්‍රියාකාරීවන්නන් ලෙසටද සැලකිය යුතුය.

ඇමුණුම 3.7.2 :

- දේව රාජ්‍යයේ වටිනාකම් ස්ථාපනය කිරීමට දරුවන් ආදර්ශයට ගත හැක්කේ කෙසේදැයි පැහැදිළි කරන්න.
- විවාදයක් සඳහා -
  "දරුවන් හිංසාවට පත් කිරීම පිළිබඳව නීතිමය පියවර ගැනීම සුදුසුය".
  "දරුවන් හිංසාවට පත් කිරීම පිළිබඳව ප්‍රේමයේ පියවර ගැනීම සුදුසුය".
- පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ළමා අයිතිවාසිකම් හා ඔවුන්ට යහපත් බලාපොරොත්තු | මුහුණ පාන ගැටළු | විකල්ප ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1. අධ්‍යාපනය | බලෙන් වැඩ පැවරීම | පාසල් යාමට අත දීම |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් වලට අනුව ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 3.8 | : | කාන්තාවන්ට නිසි සමාජ තත්ත්වයක් ලබා දෙමින් ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 3.8 | : | "කාන්තාවන්ට නිසි සමාජ තත්ත්වයක් ලබාදෙන ජීවිතයක් ගත කරමු". |
| කාලය | : | විනාඩි 40 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශුද්ධවූ බයිබලය, මාතෘකාවට අදාළ පුවත්පත් ලිපි |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.8.1 :

- කාන්තාවන් ජීවත් විය යුත්තේ කෙසේද යන්න ගැන අදහස් පැවසීමට ඉඩදෙන්න.
- පහත සඳහන් කරුණු විමසමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - වර්තමාන සමාජයේ කාන්තාවන් අතවර වලට මුහුණ පාන බව.
> - කාන්තාවන් හට නිසි සමාජ තත්ත්වයක් ලබාදෙමින් ඔවුන් පිළිගන්නා ලෙස ජීවත්වීමට අවස්ථාව සළසා දීම සඳහා මනුෂ්‍යයා ක්‍රියා කළ යුතු බව.
> - ජේසුස්වහන්සේ කාන්තාවන්ට නිසි තැන ලබා දුන් බව.
> - පුරුෂාධිපත්‍යයකින් යුත් සමාජයක නිසි තැන කාන්තාවන්ට ලබාදීම සඳහා පෙරමුණ ගත යුතු බව.

පියවර 3.8.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් 3කට වෙන්කරන්න.
- ඇමුණුම්, කඩදාසි, මාකර් පෑන් ශිෂ්‍යාවන් වෙත ලබාදෙන්න.
- කාර්යය පවරා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.8.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථම අවස්ථාව දෙන්න
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- දේව ප්‍රතිරූපයෙන් මිනිසා හා ස්ත්‍රිය මැවූ බව. උත්පත්ති 1:26-27
- පවුලේත්, පාසලේත් රැකියා ස්ථානයේත් හා සමාජයේත්, කාන්තාව දුක්විඳීමට ලක්වන බව.
- කාන්තාවට නිසි තැන ලබාදිය යුතු බව.
  ලූක් 10:38-42 - මාර්තා හා මරියා
  ලූක් 8:1-2 - කාන්තා ශ්‍රාවකයින්
  රෝම 16:1 - කාන්තා ඩීකන්වරු
- කාන්තාවන් සඳහා මිනිස් අයිතිවාසිකම් ගැන නීති පවතින බව
- දැනට කාන්තාවට යම්තාක් දුරට යහපත් තත්ත්වයක් තිබුනත් තවත් කාන්තාවට නිසි තැන ලබාදීම මගින් මනුෂ්‍යත්වය නගා සිටුවාලීමට කටයුතු කළ යුතු බව.

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :

- කාන්තාවට බලහත්කාරකමින් වන පීඩා නම් කරයි.
- මනුෂ්‍යයන්ගේ වගකීම වන්නේ කාන්තාවට උදාර මනුෂ්‍යත්වයෙන් කටයුතු කිරීම බව පීඩාවට භාජනය වූ කාන්තාවන් සමඟ සාකච්ඡා කොට පැහැදිලි කරයි.
- මනුෂ්‍යත්වය නගා සිටුවාලීම සඳහා කාන්තාව වගකීමකින් යුතුව සිය භූමිකාව රඟපෑ යුතුබව ප්‍රකාශ කරයි.
- මනුෂ්‍යත්වය නගා සිටුවීමට කාන්තාව දායකවී ඇති අන්දම විමසා කරුණු එක් රැස් කරයි.

ඇමුණුම 3.8.1 :

- මානව පැවැත්ම සඳහා කාන්තා භූමිකාව ඉතා වැදගත්ය.
- ශ්‍රී ලංකාවේ කාන්තාව පවුලේ, රැකියා ස්ථානයේ, සමාජයේ විවිධ මට්ටමින් දුක් පීඩාවලට මුහුණ පායි. දේව රාජ්‍යයේ වටිනාකම් සහිතව ඇයට නිසිතැන ලබාදිය යුතුයි.
- කාන්තා ගෝලයෝ ජේසුස්වහන්සේට සිටියෝය. ලූක් 8:1-3 මාර්තා සහ මරියාට වැදගත් තැනක් ජේසුස්වහන්සේ දුන් සේක. ලූක් 10:38-42.
- මානව අයිතීන් පිළිබඳ නීති තුළින් කාන්තාවට ගරු කළ යුතු බව අවධාරණය කරයි.
- කාන්තාවට නිසි තැන දීමෙන් පමණක් උදාර මනුෂ්‍යත්වයෙන් යුතුව ජීවත් විය හැකිය.

ඇමුණුම 3.8.2 :

- මානව සංහතිය නගා සිටුවාලීම සඳහා කාන්තාව හේතුකාරකයක් වේ.
- මානව සංහතිය විනාශ කිරීම සඳහා කාන්තාව හේතු කාරකයක් වේ යන මාතෘකාව යටතේ විවාදයක් පවත්වන්න.

නිපුණතාව 3.0 : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් වෙයි.

නිපුණතා මට්ටම 3.9 : පව්කරුවන් යැයි සලකන්නන්ට වැදගත්කමක් දී ජීවත් වෙයි.

ක්‍රියාකාරකම : "පව්කරුවන් යැයි සලකන්නන්ට වැදගත් කමක් දෙමින් ජීවත් වෙමු."

කාලය : මිනිත්තු 120 යි

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 3.9.1 හා 3.9.2, ඩිමයි කඩදාසි හා මාකර් පෑන්
- බයිබලය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.9.1 :

- ජේසුස්වහන්සේගේ කාලයේ පව්කාරයන් පිළිබඳව ශිෂ්‍ය අදහස් දක්වන්නට ඉඩ සලසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

> - ජේසුස්වහන්සේගේ කාලයේ පව්කාරයන් ලෙස වර්ග කරනු ලැබුවේ බදු අය කරන්නන් වැනි අය බව.
> - ජුදෙව් නායකයන් අවශ්‍ය කරන පිළිගැනීම පව්කාරයන්ට ලබා නොදුන් බව.
> - ජේසුස්වහන්සේ සමාජයෙන් නොපිළිගත් පව්කරුවන්ට ආදරය කළ බව.
> - සමාජයෙන් පිළි නොගත් අය සමඟ අප ජීවත් විය යුතු බව.

පියවර 3.9.2 :

- පන්තිය කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 2.2.1 හා 2.2.2, ඩිමයි කොළ හා මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.9.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- පළමු ඉදිරිපත් වන කණ්ඩායම් වලට මුල් තැන දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධන යෝජනා ලබා ගන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ජේසුස්වහන්සේ මනුෂ්‍යයන් වර්ග නොකර වෙනස්කම් රහිතව ප්‍රේම කළ බව.
- ජුදෙව් සමාජයෙන් පිළිගැනීමක් නොලැබූ පව්කරුවන්ට පිළිගැනීමක් ලබා දෙමින් ජේසුස්ව හන්සේ ඔවුන් පිළිගත් බව.
- ජේසුස්වහන්සේ සමාජයෙන් පිළිනොගත් ලෙවී යන අය ගෝලත්වයට කැඳවූ බව.
- කිසිඳු ගරුත්වයක් නොලැබූ අය අතරට ජේසුස්ව හන්සේ තමන්වහන්සේ හඳුනාගත් බව.
- සමාජ ගරුත්වය නොලැබූ අය හා අවශ්‍යතාවයෙන් පෙළෙන අය සමඟ තම මෙහෙවර තුළින් ජේසුස්ව හන්සේ බැඳුනාක් මෙන් අපද මේ ලොව වෙනස් කළ යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පව්කරුවන් පිළිබඳ විස්තර කරයි
- "ජේසුස්වහන්සේ ජුදෙව් නායකයන් විසින් පිළිනොගත් පිරිස පිළිගත් සේක". අන් අය සමඟ බයිබල් පදනමකින් බෙදා ගනියි
- සමාජයේ පිළිනොගත් පිරිස හඳුනා ගනියි
- නායකයන් විසින් පිළි නොගත් පිරිස ක්‍රිස්තියානි මිෂනාරි සේවය තුළ ගරුත්වය දී පිළිගැනීම කළ යුතු බවට පැහැදිලි කරන්නට අවශ්‍ය කරුණු රැස්කරයි.

ඇමුණුම 3.9.1

- ජුදෙව් සමාජය තුළ විවිධ කොටස් සිටියහ. ජුදෙව් නායකයන් බදු අයකරන්නන් ගරු නොකළ අතර ඔවුන් පව්කාරයන් ලෙස නම් කරන ලදී. ජේසුස්වහන්සේ මේ කොටසට යහපත් පිළිගැනීමක් ලබා දුන්සේක. එතුමා තම ගෝලයන් තෝරා ගත්තේ ඔවුන්ගෙන්ය. ලූක් 5:27-32

- එසේම මෙම සමාජය තුළ පිළි නොගත් පිරිසට නව උදාවක් ඇති කිරීම සඳහා ක්‍රියාකාරී වීම අපගේ වගකීමයි.

ඇමුණුම 3.9.2

පහත පුද්ගලයන් පව්කරුවන් පිළිබඳව දැක්වූ ආකල්ප පිළිබඳ පහත වගුවෙහි හිස්තැන් පුරවන්න.

| පව්කරුවන් | ජුදෙව් නායකයන්ගෙන්, පරිසි හා ලියන්නන් | ජේසුස්වහන්සේ |
|---|---|---|
| ලූක් 5:27-32 | නොපිළිගැනීමේ පිළිබඳ ආකල්පයක් | නිහතමානීව එක්වී ආහාර ගෙන ඔවුන්ට ගරු කළ බව |
| ලූක් 18:9-14 | | |
| ලූක් 7:36-50 | | |
| ලූක් 15 | | |
| ලූක් 19:1-10 | | |

| | | |
|---|---|---|
| නිපුණතාව මට්ටම 3.0 | : | දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත්වෙයි. |
| නිපුණතා මට්ටම 3.10 | : | සියල්ලන් පිළිගනිමින් ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 3.10 | : | "සියල්ලන් පිළිගනිමින් ජීවත් වෙමු". |
| කාලය | : | මිනිත්තු 120 යි |
| ගුණාත්මක යෙදවුම් | : | • ශුද්ධවූ බයිබලය |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.10.1 :

- සමාජයෙන් කොන්වූවන් පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.
- පහත කරුණු විමසමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- ජුදෙව් සමාජයේ ලාදුරු රෝගීන් වැනි අය සමාජයෙන් කොන්වූ බව, වේදනා විඳි බව.
- සමාජයෙන් කොන්වූවන්ට ජීවිතයක් උදාකරලීමට ජේසුස්වහන්සේ කටයුතු කළ බව. උදා: ස්පර්ශ කිරීමෙන් සුව කිරීම. මාර්ක් 5:12-16
- අප සමාජයේ කොන්වූවන්ට ආලෝකය උදා කිරීමට අප ක්‍රියා කළ යුතු බව.

පියවර 3.10.2 :

- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් වලට වෙන්කරන්න.
- කඩදාසි මාකර් පෑන්, ශිෂ්‍යයන් වෙත ලබාදෙන්න.
- කාර්යය පවරා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.10.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ප්‍රථමව ඉදිරිපත් වූ කණ්ඩායමට ප්‍රථම අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.
- පහත කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ජුදෙව් සමාජයේ ලාදුරු රෝගීන් හුදෙකලා හා සමාජයෙන් කොන්වූවන් බව. ලෙවී 13:14
  පවුලෙන් තනිවීම
  සමාජයෙන් තනිකරනු ලැබූ බව
  සභාවෙන් තනිකරනු ලැබූ බව
- සමාජයෙන් කොන්වූ ලාදුරු රෝගීන් වැන්නවුන්ට ජේසුස්වහන්සේ පූර්ණ විමුක්තිය ලබාදුන් බව.
  ධනාත්මක සබැඳියාව පවුල සමඟ
  ධනාත්මක සබැඳියාව සමාජය සමඟ
  ධනාත්මක සබැඳියාව සභාව සමඟ ලූක් 5:12-16
- සමාජයෙන් කොන්වූවන්ට පූර්ණ විමුක්තිය දිය යුතු බව.

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක :

- ජුදෙව් ටෝරාවට අනුව ලාදුරු රෝගියෙකුගේ තත්ත්වය ප්‍රකාශ කරයි.
- ලාදුරු රෝගීන් සමාජයෙන් කොන්වූවන් බව පැහැදිළි කරයි.
- ජේසුස්වහන්සේ ලාදුරු රෝගීන්ට පූර්ණ විමුක්තිය ලබාදුන් ආකාරය බයිබල් උදාහරණ මගින් එක් රැස්කොට පැහැදිළි කරයි.
- වර්තමාන සමාජයේ කොන්වූවන් හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග තීරණය කරයි. උදා: ඒඩ්ස් රෝගීන්, ජනවර්ගය, ආගම, භාෂාව, කුලය, මූලිකව කොන්වූවන්

ඇමුණුම 3.10.1 :

- ජුදෙව් සමාජයේ කොන්වූයේ ලාදුරු රෝගීන් වැන්නවුන්ය. කෙනෙකුට ලාදුරු රෝගය වැළඳුණ විට සමාජය බෙදීම් කොට පවුලෙන් සමාජයෙන් සභාවෙන් තනිකරනු ලබයි. ජේසුස්වහන්සේ ලාදුරු රෝගීන් වැනි කොන්වූවන්ට ආදරය කළ සේක. උන්වහන්සේ ඔවුන් සුව කළ සේක. ලූක් 5:12-16. ඒ මගින් බිඳ වැටුණු සබඳතා යථා තත්ත්වයට පත් කළ සේක. ජේසුස්වහන්සේ ලාදුරු රෝගීන් සමාජයෙන් පවුලෙන් කොන් නොවීම සඳහා නිරෝගී භාවය ලබාදුන්සේක. ජේසුස්වහන්සේ සුවය පෞද්ගලික මට්ටමින් ලබාදුන්නා පමණක් නොව සමාජීය මට්ටමින්ද සුවය දුන් බව පැහැදිලිවේ.
- වර්තමාන සමාජයේ ජන වර්ගය, භාෂාව, ආගම, සිතුවිලි නිසා කොන්වූවන් බහුලය. ඔවුන්ට පූර්ණ සුවය ලබාදීම සඳහා ක්‍රියාකාරී විය යුතුය. මනුෂ්‍යත්වයේ වැදගත් යුතුකම වන්නේ සමාජ සුවය ලබාදීමයි. ජේසුස්වහන්සේ වර්තමානයේදීද සමාජය සුවපත් කරන්නාක් මෙන් එය කළ යුතුය.

ඇමුණුම 3.10.2 :

කෙටි සටහන් ලියන්න
- ජුදෙව් සමාජයේ ලාදුරු රෝගය නිසා කොන්වූවන්
- යේසුස්වහන්සේ කොන්වූවන්ට පූර්ණ මානව ජීවිතයක් ලබාදුන් බව
- අප සමාජයේ කොන්වූවෝ
- ඔවුන්ට ජීවිතය උදාකරලීමට ගත හැකි ක්‍රියා මාර්ග

නිපුණතාව 4.0 : බයිබලයට අනුව එදිනෙදා ජීවිතය ගත කරයි.

නිපුණතා මට්ටම 4.1 : මේරි ජෝන්ස් බයිබලය ලබාගැනීමට දැරූ ප්‍රයත්නය තුළ දැකිය හැකි කැපවීම මෙන් කැපවීමකින් ක්‍රියා කරයි.

ක්‍රියාකාරකම 4.1 : "මේරි ජෝන්ස් මෙන් කැපවීමෙන් යුතුව බයිබලය කියවමින් එදිනෙදා ජීවිතය ගත කරමු."

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :

- මේරි ජෝන්ස්ගේ පින්තූරයක්
- ඩිමයි කඩදාසි හා මාකර් පෑන්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1 :

- මේරි ජෝන්ස් මෙනෙවියගේ රූපය දැකීමෙන් පසු ඇ ගැන දන්නා කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - මේරි ජෝන්ස් තමන්ටම බයිබලයක් ලබාගැනීමට උත්සාහ කළ බව.
> - තමාගේ ඉලක්කය ලබා ගැනීමට මේරි ජෝන්ස්ගේ ශ්‍රමය වැදගත් වූ බව.
> - අද අපද බයිබලය කියවමින් ඒ අනුව ජීවත් විය යුතු බව.

පියවර 4.1.2 :

- සුදුසු පරිදි පන්තිය කුඩා කණ්ඩායම් වලට වෙන් කරන්න.
- ඇමුණුම 4.1.1 හා 4.1.2, ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ලබා දෙන්න.
- කාර්යය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයක යොදවන්න.
- සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 4.1.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කරවන්න.
- පළමු සූදානම් කණ්ඩායම පළමු ඉදිරිපත් කරවන්න.
- සෙසු කණ්ඩායම් වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.
- පහත කරුණු ඉස්මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- මේරි ජෝන්ස් මෙනෙවිය 1784 උතුරු වේල්ස්හී මින්ඩොල් ගමේ උපත ලැබූ බව.
- මොලි මහත්මිය හා ජොන්ස් මහතා ඇගේ දිළිඳු දෙමව්පියන් බව.
- ඇය පරිශ්‍රමයකින් මුදල් උපයා බයිබලය ලබාගත් බව.
- මේරි ජෝන්ස් මෙනෙවියගේ කැපවීම සේ අපද බයිබලයට අනුව ජීවත්වීමට කැපවිය යුතු බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- බයිබලය ලබාගැනීමට මේරි ජෝන්ස් මෙනෙවිය තුළ වූ ආශාවට හේතු පැහැදිලි කරයි.
- බයිබලය ලබා ගැනීමට ඇගේ දෙමව්පියන් ඇයට උපකාර කළ බව පැහැදිලි කරයි.
- බයිබලයක් මිලදී ගැනීමට සමාජයෙන් ලැබූ සහයෝගය පිළිබඳ ගරු කරමින් අගයමින් එය පැහැදිලි කරයි.
- මේරි ජෝන්ස් මෙනෙවිය හා බයිබලය පිළිබඳ ආසාවෙන් පෙලුනු අය හඳුනාගෙන ඔවුන්ගේ නම් එකතු කරයි.

ඇමුණුම 4.1.1

- මේරි ජෝන්ස් උතුරු වේල්ස් හී මින්ඩල් නම් ගමෙහි උපත ලැබූ දිළිඳු තරුණියකි. ඇය උපත ලැබුවේ 1784 දීය. ජේකබ් ජෝන්ස් හා මොලිගේ දියණියයි.

- බයිබලය දේවස්ථානයේ කියවන විට පමණක් ඔවුනට බයිබලයට සවන් දීමට අවස්ථාව සැලසිණි. මේරි ජොන්ස් වැනි අය ඒවා මතකයේ රඳවා ගත්හ. ඔවුනට කියවීමට නොහැකි වීමද ඔවුනට මුහුණ දීමට සිදුවූ තවත් සාධකයකි.

- තෝමස් චාල්ස් දේවගැතිතුමා පාසලක් ආරම්භ කලේ බයිබලය කියවීම පුහුණු කිරීමටය. මෙයින් මේරි ජෝන්ස් උපරිම ප්‍රයෝජන ගත්තාය. ඇය එවැන්ස් මහත්මිය හමුවට බයිබලය කියවීමට ගියාය. බයිබලය ගැනීමට විශාල මුදලක් අවශ්‍ය වීම නිසාම දුප්පත් අයට බයිබලයක් ගත නොහැකි විය. මේරි ජෝන්ස් මෙම අභියෝගයට මුහුණ දෙමින් මුදල් එකතු කළාය. ඇය මේස් මසා එය විකුණමින්ද, මීපැණි, බිත්තර වැනි දෑ විකුණමින්ද, ගොවිපළේ වැඩ කරමින්ද මුදල් ඉපයුවාය. දෙමව්පියෝ ද මුදල් ලබා දෙමින් ඇයට සහයෝගය ලබා දුන්හ. හියු මහතාද විසින් ඇයට මුදල් ලබා දෙන ලදී.

- හියු මහතා මේරි ජෝන්ස්ට බයිබලයක් ලබා ගැනීමට තෝමස් චාල්ස් හරහාද උපකාර කරන ලදී. මේරි ජොන්ස් කිලෝ මීටර (සැතැප්ම 25ක්) ක් ගමන් කර කඳු පාරවල් හරහා තනිවම ගමන් කර ඩේවිඩ් එඩ්වඩ්ස්ගේ උපකාරයෙන් තෝමස් චාල්ස් මහතාගේ නිවසට ගියාය. නමුත් වේල්ස් බයිබලයක් එහි නොවීය. මන්ද, ඒ වනවිටත් එහි තිබූ අවසාන වේල්ස් බයිබලය ලන්ඩන් වල පුද්ගලයකුට විකුණා තිබුණි. එය ඇසූ ඇය දරා ගත නොහැකිව හඬා වැලපුණි. තෝමස් චාල්ස් මහතාගේද, ඩේවිඩ් එඩ්වඩ් මහතාගේද දැස්ද තෙත්විය. අවසානයේ වේල්ස් බයිබල් පිටපත ඇයට ලබාදෙන්නට තීරණය විය. මේරි ජෝන්ස් සතුටින් තම ගම්බිම් හා සමාජය වෙත පිටත්ව ගියාය. එසේම ඇය එම බයිබලය කියවා ඒ අනුව ජීවත් වෙමින් බයිබලය ගැන අන් අයට පැවසීය.

ඇමුණුම 4.1.2

මේරි ජෝන්ස් බයිබලය ලබාගත් ආකාරය රඟ දක්වන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 4.0 | : | බයිබලයට අනුව එදිනෙදා ජීවිතය ගත කරයි. |
| නිපුණතා මට්ටම 4.2 | : | බයිබලය බෙදා ගැනීමේ මෙහෙවර සඳහා තෝමස් චාර්ල්ස් දේවගැතිතුමා තුළ පැවති ප්‍රයත්නය වැනි කැපවීමකින් ජීවත් වෙයි. |
| ක්‍රියාකාරකම 4.2 | : | "බයිබලය බෙදාගැනීමේ මෙහෙවර සඳහා තෝමස් චාර්ල්ස් දේවගැතිතුමා තුළ පැවති ප්‍රයත්නය වැනි කැපවීමකින් ජීවත්වෙමු." |
| කාලය | : | විනාඩි 80 |
| ගුණාත්මක යෙදවුම් | : | • ඇමුණුම 4.2.1, ඩිමයි කඩදාසි හා මාකර් පැන්, ශු බයිබලය |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

- තෝමස් චාර්ල්ස් තුමාගේ පින්තූරයක් පෙන්වා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - තෝමස් චාර්ල්ස් වේල්සයේ බාලා නගරයේ සංචාරක දේශකයෙකු මෙන් ජීවත් වූ බව.
> - වේල්සයේ ජනතාවට බයිබල් ලබාදීමට ඔහු මහත් පරිශ්‍රමයක් ගත් බව.
> - බයිබලය කියවීමේ හැකියාව ජනතාවට ලබාදෙනු වස් කියවීමේ අවස්ථා ඇති කිරීමට උපකාරී වූ බව.
> - ඔහු තුළ පැවති කැපවීම වැනි කැපවීමකින් යුතුව බයිබලයේ අදහස් බෙදා ගත යුතු බව.

පියවර 4.2.2 :

- පන්තිය කුඩා කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- කණ්ඩායම් ගවේෂණ උපදෙස්, ඩිමයි කඩදාසි හා මාකර් පැන් කුඩා කණ්ඩායම් වලට ලබාදෙන්න.
- 4.2.1 ඇමුණුම ලබාදෙන්න.
- කාර්ය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- කණ්ඩායම් අනාවරණ සමස්ත පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 4.2.3 :

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පංතියට ඉදිරිපත් කරවන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායම් වලට ප්‍රථම අවස්ථාව ලබාදෙන්න.
- සෙසු කණ්ඩායම් වල සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- වේල්සයේ ජනතාව බයිබල් ලබාගැනීමට පොළඹවන මෙහෙවරක තෝමස් චාර්ල්ස් යෙදුණු බව.
- කියවීමේ හැකියාව ලබන පිණිස ඔහු අධ්‍යාපනික අවස්ථා ලබා දුන් බව.
- ඔහුගේ ක්‍රියා කලාපය අනුව බයිබලය වේල්ස් භාෂාවෙන් හා වෙනත් භාෂා වලින් අඩු මිළකට ලබාගත හැකිවූ බව.
- ඔහුගේ මෙහෙවර 1804 දී වේල්ස් භාෂාවෙන් බයිබල් මුද්‍රණය කිරීම සඳහාත් විකිණීම සඳහාත් (සංගමයක් මගින්) උපකාරී වූ බව.
- තෝමස් චාර්ල්ස් කැපවීමෙන් යුතුව බයිබලය බෙදා ගත්තාක් මෙන් බයිබලීය වටිනාකම් ද බෙදාගත යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තෝමස් චාර්ල්ස්ගේ මෙහෙවර විස්තර කරයි.
- බයිබල් බෙදා හැරීම පිළිබඳව ඔහුගේ ක්‍රියා කලාප පිළිබඳ තොරතුරු රැස් කරයි. (කියවීමේ හැකියාව ලබාගැනීමට ඔහු ගොඩ නැගූ පාසල් හා අඩු මිළට බයිබල් වැඩි සංඛ්‍යාවක් ලබාගැනීමට වූ හැකියාව පිළිබඳවය).
- බයිබලය බෙදා ගැනීම පිළිබඳ බයිබල් සමාගම් වල භූමිකාව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා බයිබල් සංගමයේ මෙහෙවර පිළිබඳ තොරතුරු විමසා ලියා දක්වයි.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් :

ඇමුණුම 4.2.1 :

- තෝමස් චාර්ල්ස් දේවගැතිතුමා බයිබලය බෙදා ගැනීමේ මෙහෙවරෙහි නියැලුනේය. ඔහු සංචාරක දේශකයෙක් විය.
- වේල්ස් භාෂාවෙන් කථා කළ අයට බයිබල් ලබාදීමට ඔහු පියවර ගත්තේය. කියවීමේ කුසලතාවය ලබාදීම සඳහා ඔහු පාසල් ආරම්භ කළේය. ඒ මගින් මේරි ජෝන්ස් වැන්නෝ බයිබල් ලබාගැනීම කෙරේ ආකර්ෂණය වූහ.
- එකළ දිළිඳුන්ට බයිබල් මිළදී ගැනීමේ හැකියාවක් නොවීය. බයිබල් වල මිළ අධික වූ අතර ප්‍රමාණවත් සංඛ්‍යාවක් ද නොවීය. තෝමස් චාර්ල්ස් ගේ ක්‍රියා කලාපය තුළින් වේල්ස් ජනතාවගේ අවශ්‍යතාවය පරිදි බයිබල් සැපයීම ලන්ඩන් ආගමික සමිතියට භාර විය. බයිබල් රචනා කරන ආගමික සංගමය 1804 දී ආරම්භ විය. බ්‍රිතාන්‍ය විදේශ බයිබල් සමාගම 1806 දී නව ගිවිසුම් 10000ක් ද, 1808 දී බයිබල් 20000ක්ද, නව ගිවිසුම් 30000 ක්ද, වේල්ස් භාෂාවෙන් මුද්‍රණය කරන ලදී. 1808-1818 දක්වා කාලය තුළ වේල්ස් භාෂාවෙන් රචිත බයිබල් 11000ක් අවුරුද්දක් පාසා හුවමාරු විය.
- වේල්සයේ බයිබල් හුවමාරු කර ගැනීමේ තෝමස් චාර්ල්ස්ගේ මෙහෙවර මෙන් ක්‍රියා කලාපයක් වෙනත් රටවලද විය. බයිබලයේ යහපත් වටිනාකම් වර්තමාන සංදර්භය තුළ බෙදාගත යුතුය.

ඇමුණුම 4.2.2 :

- විවාදයක් පවත්වන්න
- "බයිබලය බෙදාගැනීම හෝ බයිබලයේ යහපත් වටිනාකම් බෙදා ගැනීම වර්තමාන යුගයේ අවශ්‍යතාවය වේ/අවශ්‍යතාවය නොවේ."

# 3 කොටස

## තක්සේරුව හා ඇගයීම

| | |
|---|---|
| 7.3.1 | හැදින්වීම - තක්සේරුව හා ඇගයීම |
| 7.3.2 | ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ |
| 7.3.3 | මූලාකෘති ප්‍රශ්න |

## 7.3.1 තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කරගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබාගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීම ය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරිපෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත්විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබාදීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩ පිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුවේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂය මාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (Student-Centred), නිපුණතා පාදක (Competence - Based) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (Activity - Oriented) කරගත් ප්‍රවේශයකින් යුක්තවේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (Transformation) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂය මාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම් වල දෙවැනි පියවරේදී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරු කරණයටත් ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේදී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකිවේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණ පා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්ති කාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේදී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේම චර්යා ගොඩනැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතුවේ.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින් ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන් කර ගැනීමයි. සිසු ඉගෙනීම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කරගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයයි. මේ අනුව ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක්වේ.

- සංකල්ප සිතියම් (Concept Maps)
- බිත්ති පුවත්පත් (Wall News Papers)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (Quizzes)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් (Questions and Answer Books)
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු (Portfolios)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (Exhibition)
- විවාද (Debates)
- සාකච්ඡා මණ්ඩල (Panel Discussion)
- සම්මන්ත්‍රණ (Seminars)
- ක්ෂණික කථා (Impromptu Speeches)
- භූමිකා රංගන (Role Plays)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (Presentation of Literature Reviews)
- ක්ෂේත්‍ර පොත්/ස්වභාව අධ්‍යයන දිනපොත්/ හොඳ වැඩ පොත් (Field Books/Nature Diaries)
- ප්‍රායෝගික පරීක්ෂණ (Practical Tests)

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකිවේ.

## 7.3.2 ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝකිරීමේ උපකරණ

| | | | |
|---|---|---|---|
| 1. | පාසල් වාරය හා උපකරණ අංක | : | පළමු වාරය උපකරණ අංක01 |
| 2. | ආවරණය කරන නිපුණතා මට්ටම | : | 1.2, 1.3, 1.4, 1.5 |
| 3. | ආවරණය කරන විෂය අන්තර්ගතය | : | • ජීවීන්<br>• ආලෝක වස්තූන්<br>• සාගර සම්පත<br>• මිනිසා මැවීම |
| 4. | උපකරණ ස්වභාවය | : | • දේව මැවිල්ල වන ජීවීන්, ආලෝක වස්තූන්, සාගර සම්පත, මිනිසා මැවීම තුළ අසිරිමත් බව විදහා දක්වන සිසු ප්‍රදර්ශනය. |
| 5. | උපකරණයේ අරමුණු | : | • දේව මැවිල්ලේ අලංකාරත්වය හා අවශ්‍යතාවාදය චිත්‍රය, නිර්මාණ තුළින් විදහා දක්වයි.<br>• ඒ තුළින් මිනිස් ජීවිතයට ලබාදෙන දේව ගුණාංග මග පෙන්වීම. |
| 6. | උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් | : | • ක්‍රියාකාරකම් සන්තතියෙහි ක්‍රියාකාරකම ආරම්භයට පෙර උපකරණ පන්තියට හඳුන්වා දෙන්න.<br>• මෙය කෝවල චිත්‍ර ඇඳීමකින් හා ඒවා ප්‍රදර්ශනය තුළින් අවසන් වන බව සිසුන්ට දැන්වීම.<br>• චිත්‍ර ඇඳීමට පරිසරය නිරීක්ෂණය කළ යුතු බව සිසුන්ට දැන්වීම.<br>• නියමිත වේලාව තුළ චිත්‍ර ඇඳීමට හෝ නිර්මාණයට සිසුන් යොමු කරන්න.<br>• චිත්‍ර ප්‍රදර්ශනය පවත්වන දිනය සිසුන්ට දන්වන්න. |
| 7. | සිසුන්ට උපදෙස් | : | • ගුරුතුමිය/ගුරුතුමා දෙනු ලබන උපදෙස් වලට හොඳින් සවන් දෙන්න.<br>• පාසල් පරිසරය තුළ නිරීක්ෂණ චාරිකාවක යෙදෙන්න.<br>• පරිසරය විවිධ බව, අලංකාරය, සතුන් හා අසිරිමත් බව විදහා දැක්වීමට චිත්‍ර හා නිර්මාණ ඉදිරිපත් කරන්න.<br>• මේ සඳහා පැස්ටල්, දිය සායම් හෝ පරිසරයේ කොළ, මල්, පොතු, ආදිය වුවද භාවිතා කළ හැක.<br>• ප්‍රදර්ශනය සඳහා අවසාන නිමැවුම ඉදිරිපත් කරන්න. |

8. ඇගයීම් ක්‍රමය :

| නිර්ණායක / නම | අරමුණු පැහැදිලිව හඳුනාගැනීම | උපදෙස් **පිළිපැදීම** | නායකත්ව ලක්ෂණ | චිත්‍රයෙහි කළාත්මක බව හා නිමැවුම | කාර්යයෙහි හා වගකීම | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |
| 6. | | | | | | |

ලකුණු පරාසය : ඉතා හොඳයි 04
හොඳයි 03
මධ්‍යස්ථයි 02
සංවර්ධන විය යුතුයි 01

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ 2**

| | | | |
|---|---|---|---|
| 1. | පාසල් වාරය හා උපකරණ අංකය | : | 2 වාරය 01 උපකරණ 02 |
| 2. | ආවරණය කරන නිපුණතා මට්ටම | : | 2.2 |
| 3. | ආවරණය කරන විෂය අන්තර්ගතය | : | • මිසරයෙන් ගලවාගෙන ආ විමුක්ති ගමන තුළ ලැබූ සංරක්ෂණය |
| 4. | උපකරණ ස්වභාවය | : | • මෙම ගමනේ සිදුවූ සිදුවීම් ඇතුලත් කරමින් විනාඩි 20කට නාට්‍යයක් නිර්මාණය කිරීම. |
| 5. | උපකරණයේ අරමුණු | : | • මිසරයෙන් ගලවාගෙන ආ ගමනෙහි සංරක්ෂණ සිදුවීම් අවබෝධ කර ගනියි.<br>• ඒ තුළ දේව සංරක්ෂණය හඳුනා ගනියි. |
| 6. | උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් | : | • ක්‍රියාකාරකම් සන්තතියෙහි ක්‍රියාකාරකම් 2 ආරම්භයට පෙර උපකරණ පන්තියට හඳුන්වා දෙන්න.<br>• මෙය නාට්‍ය පංතියට ඉදිරිපත් කිරීමෙන් පසු අවසන් වන බව සිසුන්ට දන්වන්න.<br>• බයිබලය කියවා කරුණු එකතු කරමින් එම කරුණු සාරාංශ කර ගැනීමට සිසුන් යොමු කරවන්න.<br>• නාට්‍ය පිටපතක් තුළින් නිසි කරුණු ගොනු කිරීමට සලස්වන්න.<br>• නාට්‍ය පවත්වන දිනය සිසුන්ට දන්වන්න. |
| 7. | සිසුන්ට උපදෙස් | : | • ගුරුවරයා/ගුරුවරිය දෙනු ලබන උපදෙස් වලට හොඳින් සවන් දෙන්න.<br>• බයිබලය කියවා කරුණු සාරාංශ කරන්න.<br>• කණ්ඩායම අතර අදහස් බෙදා ගන්න.<br>• ඒ තුළින් නාට්‍ය පිටපතක් ගොඩ නගන්න.<br>• සම්පත් භාවිතා කරමින් නාට්‍ය ඉදිරිපත් කරන්න. |

**ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ**

| | | | |
|---|---|---|---|
| 1. | පාසල් වාරය හා උපකරණ අංකය | - | තුන්වන වාරය 03 |
| 2. | ආවරණයවන නිපුණතා මට්ටම | - | 3.9, 3.10 |
| 3. | ආවරණය කරන විෂය සන්ධාරය | - | පව්කරුවන් යයි සලකන්නන්ට වැදගත් කමක් දී ජීවත් වීම<br>සියල්ලන් පිළිගනිමින් ජීවත් වීම |
| 4. | උපකරණයේ ස්වභාවය | - | සමාජයෙන් කොන්වූවන් පිළිබඳ අප සමාජය ඇසුරින් ලැයිස්තුවක් සකස් කරයි. |
| 5. | උපකරණයේ අරමුණු | - | ඔවුන් වෙනුවෙන් කළ හැකි යමක් ගැන සොයා බලයි.<br><br>ලැයිස්තුවට අදාළ කණ්ඩායමක් තෝරාගෙන තොරතුරු රැස්කරයි.<br><br>ඔවුන් පිළිබඳව තොරතුරු සොයාබලයි. |
| 6. | උපකරණය ක්‍රියාත්මක කිරීමට උපදෙස් | - | ගුරුවරයා ක්‍රියාකාරකම් සන්තතියේ 3.9, 3.10 ආරම්භ කිරීමට පෙර මෙම උපකරණය පන්තියට හඳුන්වා දෙන්න.<br><br>කෝවලව තෝරාගන්නා ලද මාතෘකා ඔස්සේ කණ්ඩායම් කීපයක් අවසාන ක්‍රියාකාරකම බව සිසුනට දන්වන්න.<br><br>පුවත්පත් වලින් ලබාගත් තොරතුරු ලබාගැනීමට උපදෙස් දෙන්න.<br>සටහන වරින්වර නිරීක්ෂණය වාර්තා කරන්න.<br><br>ඔවුන්ගේ නිදහස් අදහස් තුළින් පොත් පිංච සකස් කිරීමට යොමු කරන්න.<br>අවසාන නිමැවුම භාරදිය යුතු දිනය දන්වන්න. |

## 7. ඇගයීම් ක්‍රමය

| නිර්ණායක / නම | අරමුණු ඉටුවීම | ඉදිරිපත් කිරීම සන්නිවේදනය | සම්පත් භාවිතය වචන හැසිරීම | කරුණු ගොනු කිරීම | නායකත්වය හා කාල පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |
| 6. | | | | | | |

ලකුණු පරාසය : ඉතා හොඳයි 04
හොඳයි 03
මධ්‍යස්ථයි 02